වාර්ෂික වාර්තාව - 2020

ජාතික පර්යේෂණ සභාව

ජාතික පර්යේෂණ සභාව
120/7, විද්‍යා මාවත, කොළඹ 07
දුරකථන අංකය: 011-2675176 ෆැක්ස්: 011-2675136
ඊ-මේල්: admin@nrc.gov.lk වෙබ්: www.nrc.gov.lk

පටුන

පටුන 1

දැක්ම සහ මෙහෙවර 2

අරමුණු 3

කාර්යයන් 4

කවුන්සිලය (2020-01-01 සිට 2020-12-31දක්වා) 5

කාර්ය මණ්ඩලය 6

සභාපතිතුමාගේ පණිවුඩය 7

ප්‍රධාන විධායක නිලධාරී වාර්තාව 8

පසුගිය වර්ෂ 3 සඳහා අදාල මූල්‍ය සුවිශේෂිතාවන් 12

ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන් 14

2020 වසරේ විශේෂ අවස්ථා 18

ඉලක්කමත පදනම් බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන 18

අන්වේෂකමත පදනම් පර්යේෂණ ප්‍රදාන 24

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන 27

රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා වැඩසටහන 27

ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන වැඩසටහන 30

වෙනත් වැඩසටහන් 31

වාර්ෂික ගිණුම් 34

විගණකාධිපති වාර්තාව 3..

සම්බන්ධවීම සඳහා තොරතුරු 3..

දැක්ම

“දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට
ශ්‍රී ලංකාව පත් කිරීම”

මෙහෙවර

“මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය,
මූල්‍යනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ
ශ්‍රී ලංකාවේ මානව සම්පත් වර්ධනය තුළින්
දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම”

අරමුණු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2016 අංක 11 දරණ පනත හා අනුකූලව, ජාතික පර්යේෂණ සභාවේ අරමුණු වන්නේ;

- රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කරගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහායවීම;

- ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය සහ ඒ සඳහා පහසුකම් සැලසීම; හා

- විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීම;

කාර්යයන්

- සභාවේ අරමුණු ළඟා කරගනුවස් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන සලසාදීම;
- පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරනු ලබන ආයෝජනයන් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කරනු පිණිස, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන හා සම්බන්ධ විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සුපරීක්ෂණය සිදුකිරීම;
- සභාවෙහි කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ පිළිගත් දේශීය හෝ විදේශීය ප්‍රභවයන් වෙතින් උපකරණ, අරමුදල් සහ අනෙකුත් සහායයන් ලබාගැනීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් පිළිබඳව සිදුකෙරෙන පර්යේෂණයන්හි වාර්තා, වාර සඟරා සහ පත්‍රිකා ඒකරාශී කිරීම, මුද්‍රණය සහ ප්‍රකාශයට පත්කිරීම;
- දේශීය හෝ විදේශීය විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි සිදුකෙරෙන විද්‍යාත්මක අධ්‍යයනයන් හෝ විද්‍යාත්මක කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව පිරිනැමීම;
- විද්‍යාව හා තාක්ෂණයට අදාළව සිදුකෙරෙන පර්යේෂණ හා නවෝත්පාදන පිළිගැනීමට ලක්කිරීමේ සහ ඒවාට සම්මාන ප්‍රදානය කිරීමේ ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම; සහ
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් ආශ්‍රිතව සිදුකෙරෙන පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

කවුන්සිලය (2020-01-01 සිට 2020-12-31 දක්වා)

සභාපති

1. මහාචාර්ය එස්.එච්. දොඩම්පහල (2020.01.20 දින වැඩ බාරගනු ලැබිය)

අනෙකුත් සාමාජිකයින්

2. මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
3. මහාචාර්ය කේ.පී.එස්.සී. ජයරත්න
4. මහාචාර්ය ආර්.ටී. සේරසිංහ
5. මහාචාර්ය එම්.ඩී.ඒ.එල්. රණසිංහ
6. මහාචාර්ය ඕ. අමරසිංහ
7. ආචාර්ය ඒ.ඩී.පී.ද එස්. අරුණතිලක
8. ආචාර්ය බී.සී.එස්. පෙරේරා
9. ආචාර්ය එම්.එන්. ගමගේ
10. ආචාර්ය ඒ. පැස්කුවල්

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත

11. නන්දනී සමරවික්‍රම මිය

භාණ්ඩාගාර නියෝජිත

12. ඩබ්ලිව්. විමලසේන මයා

කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක නිලධාරී:	එම්.සී. රාජපක්ෂ
සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක කටයුතු):	පී. කේ. ඒ. එස්. ආර්. නෝනිස්
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මූල්‍ය):	ආර්. ඩී. එස්. දිසානායක
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	කේ.එන්.කේ. දිසානායක
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	එස්.එස්. කටුගම්පල
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	එම්.එස්. පෙරේරා
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	බී.එම්.එන්.සී. කරුණාරත්න
පරිපාලන නිලධාරී:	ඒ.කේ.ඩි.එම්. පෙරේරා
ගිණුම් නිලධාරී:	ඒ.ඊ.කේ. දයාරත්න
ප්‍රසම්පාදන නිලධාරී:	ඩබ්.ඩී.ටි.ඩි. වික්‍රම
කළමනාකරණ සහකාර:	එස්.එච්.එස්. ප්‍රියංකර
කළමනාකරණ සහකාර:	එම්.ඩී.ටී. මධුෂානි
කළමනාකරණ සහකාර:	එම්.එස්. සෙව්වන්දි
කළමනාකරණ සහකාර:	එම්.ඒ.කේ.එල්. පෙරේරා
කළමනාකරණ සහකාර:	කේ.ඒ.ඩී.එම්. කරුණාසිංහ
කළමනාකරණ සහකාර:	එන්.ඊ. අත්තනායක
කළමනාකරණ සහකාර:	ඩබ්.ජී.පී. ප්‍රියදර්ශන
කළමනාකරණ සහකාර:	ඩබ්.එස්.ඩී. පෙරේරා
රියදුරු:	කේ. කේ.ටී. සඳරුවන්
රියදුරු:	එස්.එස්. ජයසිංහ

2020.12.31 දිනට

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික පර්යේෂණ සභාවේ 2020 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට ලැබීම සතුටකි.

COVID-19 වසංගතය හා ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ මුහුණදුන් බාධාවන් හමුවේ වුවද, 2020 වසරේදී ජාතික පර්යේෂණ සභාව සිය කාර්යයන් සාර්ථකව සිදුකරනු ලැබීය. මෙම වසර තුල දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයින්, ව්‍යවසායකයින් හා වෙනත් පාර්ශවකරුවන් ගණනාවක් සමග නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අත්වැල් බැඳ ගතිමු. අපගේ විද්‍යාඥයින්ට ඉහලම පිළිගැනීමක් ලබාදීම සඳහා අඛණ්ඩව කටයුතු කරමු.

COVID-19 වසංගතය මගින් පර්යේෂණ ඇතුලු සෑම අංශයකම පාහේ කැපීපෙනෙන බලපෑමක් ඇතිවිය. ඒ අතරම නව විෂබීජනාශක තාක්ෂණයන් සිට COVID-19 වයිරසයට එරෙහි එන්නත් නිපදවීම දක්වා නවෝත්පාදන විශාල සංඛ්‍යාවක් බිහිවීමේ අවස්ථාවක් සැලසිණ. ශ්‍රී ලංකාව තුල COVID-19 පැතිරීම ආරම්භවූ කාලයේදීම ජාතික පර්යේෂණ සභාව විසින් අදාල බලධාරීන්ට සිය නිර්දේශ ලබාදෙනු ලැබීය. තවද, අප විසින් COVID-19 පාලනය කිරීම අරමුණු කරගත් කෙටි කාලීන පර්යේෂණ හා නවෝත්පාදන සඳහා සහය ලබාදීමට විශේෂ ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන වැඩසටහනක් හරහා ප්‍රදානයන් ලබාදෙනු ලැබීය. ප්‍රජාව තුල රෝගීන්ගේ සංචරණය හඳුනාගැනීම සඳහා භාවිතා කළහැකි නවෝත්පාදනයක් වන 'ස්වාරක්ෂා' වැනි ජංගම දුරකථන ඇප් එකක් නිපදවීමට අපට හැකි විය. ඊට අමතරව ජාතික පර්යේෂණ සභාව විසින් 2020 වසරේදී ද ආයතනයේ පහත සඳහන් වැඩසටහන්ද සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කරනු ලැබීය; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, සමාජ සුභසාධක වැඩසටහන සහ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන.

කවුන්සිල සාමාජිකයින් හා ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන ලද දායකත්වය අගය කරන අතරම මෙම අභියෝගාත්මක වසර තුල ජාතික පර්යේෂණ සභාවට ලබාදුන් සහය හා දිරිමත්කිරීම වෙනුවෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට මාගේ කෘතඥතාවය පලකරනු කැමැත්තෙමි.

මහාචාර්ය හේමන්ත දොඩම්පහල
සභාපති

ප්‍රධාන විධායක නිලධාරි වාර්තාව

ජාතික පර්යේෂණ සභාවේ 2020 වසරේ වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් ලබාදීමට මා මෙය අවස්ථාවක් කරගනිමි. COVID-19 වසංගතය හේතුවෙන් මෙම වසර ආයතනයට අනපේක්ෂිත අභියෝග ගෙනදුන් වසරක් විය. මෙම වයිරසය අපට බොහෝ දේවල් මතක්කර දෙනු ලැබීය, ඉන් එකක් නම් රටවල් අතර දේශසීමා නොමැති බවත් අප සියලු දෙනා එක් ග්‍රහලෝකයකට අයත් බවත්ය. COVID-19 වයිරසය පැතිරීම සඳහා විසඳුම් සොයාගැනීමේදී මෙන්ම එන්නත් නිෂ්පාදනයේදී ද විද්‍යාව හා තාක්ෂණය හා සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධනයන් ඉදිරියෙන්ම ඇත.

ජනාධිපති ලේකම්කාර්යාලය යටතේ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද NRC ක්‍රමයෙන් එහි වත්මන් තත්වය දක්වා ස්ථාවර ලෙස වර්ධනය විය. අද වන විට ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ සඳහා මූල්‍යාධාර ලබාදෙන ප්‍රමුඛ ආයතනය ලෙස පර්යේෂණ වැඩසටහන් ගණනාවන් සඳහා පහසුකම් සලසන අතර ගුණාත්මක පර්යේෂණ කෙරේ වැඩි අවධානයක් යොමුකරන ආයතනයක් වන එමගින් විද්‍යාඥයින්ගේ පර්යේෂණ සඳහා පිළිගැනීමක් ලබාදීම මෙන්ම ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සමග යමින් පර්යේෂණ ප්‍රතිඵල මගින් ඇතිවන බලපෑම ඇගයීම සිදුකරනු ලැබේ.

නව සභාපතිවරයා වන මහාචාර්ය හේමන්ත දොඩම්පහල මහතා 2020 ජනවාරි මස පත්කරනු ලැබූ අතර තවත් කවුන්සිල සාමාජිකයින් හය දෙනෙකු හා නිලබලයෙන් පත්වන සාමාජිකයින් දෙදෙනෙකු 2020 මාර්තු මාසයේදී පත්කරනු ලැබීය. අනතුරුව වසරේ පසු කාලීනව තවත් කවුන්සිල සාමාජිකයින් දෙදෙනෙකු පත්කරනු ලැබීය.

2020 මාර්තු මාසයේදී රට වසා දමනු ලැබූ නමුත් කවුන්සිල රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් ආදී මාර්ගගතව සිදුකළ හැකි සියලු කාර්යයන් අඛණ්ඩව සිදුකරනු ලැබීය. රජය විසින් නිවසේ සිට රාජකාරි කිරීමේ නව සංකල්පය හඳුන්වාදීමත් සමග කාර්ය මණ්ඩලය විසින් කාර්යයන් බොහොමයක් මාර්ගගතව ක්‍රියාත්මක කරනු ලැබූ අතර මූල්‍යමය කටයුතු සීමිත ප්‍රමාණයකින් සිදුකරනු ලැබීය.

2016 අංක 11 දරණ පනත හා අනුකූලව ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන අරමුණු වන්නේ, (i) රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම සඳහා විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහාය ලබාදීම, (ii) ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් වැඩිදියුණු කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම සහ (iii) විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීමයි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රමුඛ කාර්යය වනුයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පර්යේෂකයින්ට පර්යේෂණ සිදුකිරීම සඳහා ප්‍රදානයන් ලබාදීම, විද්‍යාඥයින් පිළිගැනීමට ලක් කිරීම හා සම්මාන පිරිනැමීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස්කිරීම සහ පර්යේෂණ සඳහා රජයේ ආයෝජනය ඵලදායි ලෙස යොදාගැනීම පිණිස පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය කිරීමවේ.

මෙම වැදගත් අභිමතාර්ථ ලභාකර ගැනීම සඳහා 2020 වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන, සමාජ සුභසාධක වැඩසටහන සහ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන.

COVID-19 සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සිදුකිරීමේ හදිසි අවශ්‍යතාවය සලකා, 2020 දී විද්‍යාඥයින් සඳහා 'ඉක්මන් ප්‍රතිචාර පර්යේෂණ ප්‍රදාන' වැඩසටහන හඳුන්වා දෙනු ලැබීය. ප්‍රදානයෙහි උපරිම සීමාව රු.500,000ක් වන අතර අරමුදල් භාවිතා කිරීමේ නම්‍යශීලිත්වය සහිතව මුදල් අමාත්‍යාංශය විසින් ලබාදුන් උපදෙස් වලට අනුව මාර්ගෝපදේශ සකස්කරනු ලැබීය. මේ සඳහා ලැබුණු යෝජනාවල එකතුව

35ක් වන අතර ඉන් 9ක් සඳහා ප්‍රදානයන් පිරිනමන ලදී.

1999දී ආරම්භ කරන ලද අන්වේෂක මත පදනම් පර්යේෂණ ප්‍රදාන වැඩසටහන පසුගිය 21 වසර පුරාම ක්‍රියාත්මක විය. එය විද්‍යාඥයින්ට නවෝත්පාදන පර්යේෂණ සිදුකිරීමට හා නව දැනුම නිර්මාණය කිරීම සඳහා පහසුකම් සලසන කරගකාරී ප්‍රදාන යෝජනාක්‍රමයකි. වාර්ෂිකව සිදුකරන විවෘත අයදුම්පත් කැඳවීමේදී අයදුම්කරුවන්ට කිසියම් විද්‍යාත්මක ක්ෂේත්‍රයකින් අයදුම්කළ හැකිවේ. 2020 වසර තුලදී අයදුම්පත් 133ක් ලැබූ අතර ඉන් 37ක් මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගනු ලැබූ අතර පශ්චාද් උපාධි අධිශිෂ්‍යත්ව 13ක් හා පශ්චාද් ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව 2ක් ලෙස ප්‍රදානයන් 15ක් පිරිනමනු ලැබීය. වසර තුල 100කට වැඩි ප්‍රදානයක් සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පැවතිණ. ප්‍රදානයන් 46ක අවසාන ප්‍රගති සමාලෝචනය නිමකරනු ලැබීය, ජාත්‍යන්තර ප්‍රකාශන 59ක් සමග පශ්චාද් උපාධි අපේක්ෂකයින් විසින් ආචාර්ය උපාධි 18ක් හා දර්ශනපති උපාධි 20ක් නිමකරනු ලැබූ අතර ජාත්‍යන්තර සමුළු 41ක් හා දේශීය සමුළු 125ක් හරහා පර්යේෂණයන්හි සොයාගැනීම් පිළිබඳව ප්‍රචාරය කරනු ලැබීය.

ප්‍රතිඵල විශ්ලේෂණය දැන් ජාතික පර්යේෂණ සභාවේ ඇගයුම් ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසක්ව ඇත. ආර්. මහින්දපාල වාර්තාව (2018) අනුව නිමකරන ලද ප්‍රදානයන් අතරින් (වසර 2005 හා 2011 අතර කාලයේදී) එහි පර්යේෂණ ප්‍රතිඵල මගින් ඉතා ඉහල බලපෑමක් ඇතිකළ හැකි ප්‍රදානයන් 8ක් තෝරාගනු ලැබීය. මේ අතරින් සහජ මන්දතයිරොයිඩතාව (congenital hypothyroidism-CH) පිළිබඳව සිදුකරනු ලැබූ පර්යේෂණයේ බලපෑම ඇගයීමේ අධ්‍යයනය නිමකර ඇත. ආයෝජනය මත ඉහල ප්‍රතිඵලයක් ලබාදෙමින් මෙම පර්යේෂණය 2016 වසරේදී ජාතික ප්‍රතිපත්තියක් සඳහා මග සළසනු ලැබීය. 2019 වර්ෂය තුල අලුත උපන් බිළිදුන් 159,559ක් පරීක්ෂාකරනු ලැබූ අතර එයින් බිළිදුන් 126දෙනෙකු තයිරොක්සින් ඌනතාවයෙන් පෙලෙන බව තහවුරු විය. 2019 වර්ෂය තුලදී සම්පූර්ණ පිරිවැය රු.මිලි. 98 ක් හා සම්පූර්ණ ප්‍රතිලාභය රු.මිලි. 356.5ක් වූ මෙම වැඩසටහනෙහි පිරිවැය ප්‍රතිලාභ අනුපාතය 3.60ක් විය. අවසාන නිගමනය වන්නේ, අවදානම් සහිත බිළිදුන් නියමිත කාලයේදී හඳුනාගැනීම මෙන්ම සමාජයට ඇතිවන ආර්ථික බලපෑම සුදුසු පරිදි සාධනීයව කළමනාකරණය කිරීම යන දෙකෙන්ම සහජ මන්දතයිරොයිඩතාව (CH) පරීක්ෂා කිරීමේ ඵලදායිතාවය තහවුරු වන බවයි.

2012දී ආරම්භ කරන ලද රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) වැඩසටහන මගින් රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන හා විශ්ව විද්‍යාලවල විද්‍යාඥයින් හා පෞද්ගලික අංශය අතර හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසේ. මෙම ව්‍යාපෘති මගින් විසඳුම් ලබාදිය යුතු පර්යේෂණ ක්ෂේත්‍ර හා ඒවායේ වාණිජමය ශක්‍යතාවය පැහැදිලිවම හඳුනාගැනේ. වසර තුල ජංගම ටැබ්ලට් වල අනු සටහන් සඳහා ඩිජිටල් වේදිකාවක් යනුවෙන් වන එක් ව්‍යාපෘතියක් නිමකරනු ලැබීය. වසර තුල අයදුම්පත් 6ක් ලැබුණු අතර ඉන් 4ක් ඉදිරිපත් කිරීම් සඳහා තෝරාගනු ලැබීය. මෙම වසර තුල ක්‍රියාත්මකව පවතින සම්පූර්ණ PPP වැඩසටහන් සංඛ්‍යාව 7කි. රබර්-පොලි එතිලීන් සෙවිලි තහඩු, තේ කර්මාන්තය සඳහා ස්වයං පවිත්‍රකරණ පෙන්රයක්, සලකුණු නොමැති ටයර් (non-marking tires) යන ප්‍රදානයන් 3හි පර්යේෂණ කටයුතු නිමකරනු ලැබූ අතර අවසන් තීරණ හා ප්‍රතිඵල පිළිබඳව නිගමනය කලයුතුව ඇත.

විද්‍යාත්මක ප්‍රජාව හා කර්මාන්ත, ව්‍යවසායන් අතර සෘජුවම විද්‍යාත්මක පර්යේෂණ හා තාක්ෂණ සහයෝගිතාවය මෙන්ම පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හිදී වෙළඳපල අවස්ථා ඇතිකිරීම වෙනුවෙන් ජාතික පර්යේෂණ සභාව විසින් ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමකට ඇතුලත්වීම මෙම වසර තුල රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහනෙහි සුවිශේෂී සංධිස්ථානයක් විය.

පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම තුලින් ජාතික වශයෙන් වැදගත් ගැටලු සඳහා දිගුකාලීන විසඳුම් සොයාගැනීම සඳහා 2013 වසරේදී ඉලක්ක මත පදනම් බහු-විෂයානුබද්ධ (TO) පර්යේෂණ වැඩසටහන ආරම්භකරනු ලැබීය. මෙම වසරේදී දියවැඩියා රෝගය සඳහා ඖෂධීය හා පෝෂ්‍ය ගුණයෙන් යුත් බහුශාකසාර ඖෂධයක් පිළිබඳ පර්යේෂණය සඳහා එක් ප්‍රදානයන් පිරිනැමීය. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති නවය ඇගයීම හා අධීක්ෂණය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීණ. 2014 වසරේදී මූල්‍යාධාර ලබාදෙන ලද ව්‍යාපෘති පහෙන් එකක් වන ‘රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක්’ යන මැයෙන් වූ ව්‍යාපෘතියේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් නිමකර ඇගයීම් සිදුකරනු ලැබූ නමුත් සමාලෝචන රැස්වීම් හා විශේෂඥ මණ්ඩල සාකච්ඡා සිදු කිරීමෙන් අනතුරුව කවුන්සිලය මගින්

අවසන් තීරණයන්ට එළඹිය යුතුව ඇත. CKDu රෝගයේ බලපෑමට ලක්ව ඇති අය සඳහා විසඳුම් සොයා ගැනීමේදී මෙම පර්යේෂණ ප්‍රතිඵල වැදගත් වනු ඇත. මෙම ව්‍යාපෘති 05හි සාර්ථකත්වය මගින් TO පර්යේෂණ ප්‍රදාන වැඩසටහනෙහි සාර්ථකත්වය පිළිබිඹුවේ. 2014 වසරේ ලබාදුන් ප්‍රදානයන් හරහා ක්‍රියාත්මකව පවතින අනෙක් වැඩසටහන් හතර මගින්ද වසර තුල ප්‍රතිඵල ගණනාවක් ලබාදී ඇති අතර ඉන් සමහරක් එහි පාර්ශවකරුවන් සමග දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

තම පර්යේෂණයන්හි තත්වය ජාත්‍යන්තර මට්ටමට ළඟාකරගත් විද්‍යාඥයින්ට හිමිවිය යුතු පිළිගැනීම ලබාදීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන (PASR) වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. 1999 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන මගින් විද්‍යාත්මක ප්‍රකාශනයන්හි ශීඝ්‍ර වැඩිවීමත් සමගින් ශ්‍රී ලංකාවේ පර්යේෂණයන්හි තත්වය වැඩිදියුණු කිරීම සඳහා සුවිසල් දායකත්වයක් ලබාදී ඇත. ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වැඩසටහනක් වන PASR වැඩසටහන ලෝක විද්‍යා දිනයට සමගාමීව නොවැම්බර් මාසයේදී පවත්වන නමුත් COVID 19 නිසා ඇතිවූ සෞඛ්‍යමය සීමාකිරීම් හේතුවෙන් මෙම වසරේදී නොපැවැත්වූ අතර එය 2021 වසරේදී පැවැත්වෙනු ඇත. විද්‍යාත්මක ප්‍රකාශන 100ක් තෝරාගැනීම සඳහා වන දත්ත සම්පාදනය නිමකරනු ලැබ ඇති අතර එහිදී විද්‍යාඥයින් 317 දෙනෙකු සඳහා සම්මාන පිරිනමනු ඇත.

දශකයකට වැඩි කාලයක් පුරා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයන් සඳහා ලබාදුන් කැපීපෙනෙන දායකත්වය, නායකත්වය හා සාර්ථකත්වය වෙනුවෙන් විශේෂ ඇගයීමකට ලක්විය යුතු පුද්ගලයින්ට උපහාර දැක්වීම සඳහා නව සම්මාන ප්‍රදාන වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය. මෙම සම්මාන 'විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනයන්හි විශිෂ්ඨත්වය සඳහා වන ජීවිත කාලීන සම්මාන' ලෙස නම්කරනු ලැබීය. මෙම ජීවිත කාලීන සම්මාන ඔවුනගේ විශේෂඥතාවය ඇති ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන සමබන්ධයෙන් සාර්ථකත්වයක් පෙන්නුම් කළ හා ලබාදුන් දායකත්වය ඇගයීමට ලක්කළ යුතු ශ්‍රී ලාංකිකයින්ට රජය මගින් පිරිනමනු ඇත. වැඩසටහන 2021 වසරේ සිට ඉදිරියට ක්‍රියාත්මක වනු ඇත.

සුභසාධක වැඩසටහන මගින් ජාතික පර්යේෂණ සභාව සමාජය සමග සම්බන්ධ කෙරේ. පර්යේෂණ හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් නැගී එන තාක්ෂණයන් පිළිබඳ "INNO-TECH" ප්‍රදර්ශනය 2020 මාර්තු මස හෝමාගමදී පැවැත්වීමට සංවිධානය කරනු ලැබීය. එහිදී ජාතික පර්යේෂණ සභාව තම ප්‍රදානයන්ගේ, විශේෂයෙන්ම රොබෝ විද්‍යාව, ඩ්‍රෝන තාක්ෂණය, ජල පවිත්‍රකරණය, නිවාස හා ඉදිකිරීම් ආදී නව තාක්ෂණයන්ට අදාල නව පර්යේෂණයන්හි විශේෂ නිමයුම් ප්‍රදර්ශනය කරනු ලැබීය. නැගී එන තාක්ෂණයන් සම්බන්ධයෙන් තරුණ පිරිස් උනන්දුවක් දක්වන බැවින් විශේෂයෙන් පාසල් සිසුන් ඇතුලුව විශාල නරඹන්නන් පිරිසක් NRC ප්‍රදර්ශන කුටිය නැරඹීමට පැමිණියහ. කෙසේවුවද, 2020 මාර්තු මාසයේදී COVID-19 වසංගතය නැවත හිස ඉසවීම හේතුවෙන් සැලසුම්කළ පරිදි ප්‍රදර්ශනය පැවැත්විය නොහැකි විය.

2021 අයවැය කැඳවිමේදී, පර්යේෂණ සඳහා වැයකරන සම්පත් උපරිම ඵලදායිතාවයකින් කළමනාකරණය කිරීම සඳහා, රටේ ඇති විවිධ පර්යේෂණ ආයතන ජාතික පර්යේෂණ සභාවට අනුබද්ධ ආයතන ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය 'රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ' යටතේ ජාතික පර්යේෂණ සභාවට පවරනු ලැබීය. ව්‍යාපෘතිය පිළිබඳව සාකච්ඡා කිරීම හා ක්‍රියාත්මක කිරීම ලබන වසරේදි සිදුකරනු ඇත.

තවද විශේෂ ව්‍යාපෘතියක් වන 'පිළිකා කලින් හඳුනා ගැනීම සඳහා ජාතික නිර්දේශක රසායනාගාරය' පිළිබඳව වසර තුල සාකච්ඡාවට ගනු ලැබූ අතර අවශ්‍ය අරමුදල් ලබාගැනීම සඳහා යෝජනාව භාණ්ඩාගාරයට ඉදිරිපත්කර ඇත. මෙම ව්‍යාපෘතිය කොළඹ විශ්ව විද්‍යාලය සමග සහයෝගීතා වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජනාවී ඇත.

NRC ප්‍රදානයන්හි වටිනා පර්යේෂණ සොයාගැනීම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවත්පත් ලිපි හයක් පළකරනු ලැබීය. අපගේ ප්‍රදාන වැඩසටහන් හරහා සිදුකරන ලද පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පිලිබඳව විවිධ අමාත්‍යාංශ හා පාර්ශවකරුවන් යාවත්කාලීනව දැනුවත් කිරීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් එම ආයතන වෙත වාර්තා 42ක් ද ඉදිරිපත් කරනු ලැබීය.

ජාතික පර්යේෂණ සභාව උසස් මට්ටමකට ගෙන ඒමට අප්‍රතිහත සහයක් ලබාදුන් කවුන්සිල සාමාජිකයින්ට මෙන්ම මෙම වසරේදී ද අපට සහයෝගය දැක්වීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ සහ රේඛීය අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පළ කරමි.

ජාතික පර්යේෂණ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 21ක් වන අතර වසර තුල ස්ථීර කාර්ය මණ්ඩලය සඳහා නව සාමාජිකයින් 02නෙක් බඳවාගනු ලැබූ අතර එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙක් පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා ඉල්ලා අස්විය. කාර්ය මණ්ඩලය පෙබරවාරි මාසයේදී වාර්ෂික දැනුම හා පළපුරුද්ද ලබාගැනීමේ චාරිකාවට සහභාගිවූ අතර සිදුකරනු ලැබූ පර්යේෂණ නිරීක්ෂණය කිරීමට හා ක්ෂේත්‍රයේ හා පර්යේෂණාගාර තුල සිදුකරන පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා පළමු දිනයේදී රත්නපුරයේ සබරගමුව විශ්ව විද්‍යාලයට සංචාරය කරන ලදී. පසු දින ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයට හා පැලවත්ත කිරි කර්මාන්ත ශාලාවට සංචාරය කරනු ලැබීය. රට තුල පැවති COVID-19 තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහන් සඳහා සහභාගි විය නොහැකි විය. මෙම දුෂ්කර වර්ෂය තුල ආයතනයේ සියලු කාර්යයන් ඉටුකරමින් ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා තම අඛණ්ඩ සහය ලබාදීම පිළිබඳව ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙමි.

2020 වසර සඳහා ජාතික පර්යේෂණ සභාවේ ප්‍රාග්ධන වියදම් ලෙස රු.මිලි.75.2ක් හා පුනරාවර්තන වියදම් ලෙස රු.මිලි.28.6ක් වෙන්කරනු ලැබූ අතර පිළිවෙලින් රු.මිලි.75.2ක් හා රු.මිලි.26.5ක් ලැබුණි. 2019 මූල්‍ය වසර සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද විගණන වාර්තාව මගින් ආයතනය සඳහා අංක 2 මතයක් ලෙස ශ්‍රේණිගත කරන ලද තත්වාගණනය කරන ලද මතයක් ලබාදී ඇත.

මෙම 2020 වසර සඳහා වන වාර්ෂික වාර්තාව මගින් වසර තුල ආයතනය ලභාකරගත් ප්‍රතිඵල දැක්වෙන අතර ඉදිරි වසරේදීද අපගේ පර්යේෂණ ප්‍රජාව වෙනුවෙන් සේවය කිරීමට අපේක්ෂා කරන්නෙමු.

මනීෂා සී. රාජපක්ෂ
ප්‍රධාන විධායක නිලධාරි

පසුගිය වර්ෂ 3 සඳහා අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන්

වැඩසටහන් (ක්‍රමෝපායන්)		භෞතික ප්‍රගතිය			මූල්‍ය ප්‍රගතිය රු.මිලි.		
	දර්ශකය	2018	2019	2020	2018	2019	2020
ජාතික පර්යේෂණ සභාවේ පොදු පරිපාලනය					22.80	23.65	26.5
පහත වැඩසටහන් සඳහා සංවර්ධන සහය					161.27	88.23	75.2
ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (2014 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී	වැඩසටහන් කිසිවක් ආරම්භ නොකෙරිණ	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී			
පෞද්ගලික රාජ්‍ය සහයෝගිතා වැඩසටහන (2013 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් 3ක් ආරම්භ කරන ලදී.	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී	වැඩසටහන් කිසිවක් ආරම්භ නොකෙරිණ.			
අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන වැඩසටහන (1999 වර්ෂයේදී ආරම්භ කරන ලදී)	පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 24ක් පිරිනමනු ලැබීය. පරිසර හිතකාමී වල්පැලෑටි පාලනය (EWC) සඳහා විශේෂ ප්‍රදානයන් 04ක් පිරිනමනු ලැබීය.	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 28ක් පිරිනැමීය	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 19ක් පිරිනමනු ලැබීය.	-	-	-

	පිරිනමන ලද ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව.	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 23ක් පිරිනමනු ලැබීය	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 20ක් පිරිනමනු ලැබීය.	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 22ක් පිරිනමනු ලැබීය.			
විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන (PASP) වැඩසටහන (2001 වර්ෂයේදී ආරම්භ කෙරිණි)	පවත්වනු ලැබූ සම්මාන උළෙල හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව	2016 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර විද්‍යාඥයින් 338 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	2017 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර ප්‍රකාශන 100 ක් සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	COVID වසංගතය හේතුවෙන් PASP සම්මාන උළෙල නොපැවැත්වූ නමුත් සහරාවල පලවූ ප්‍රමුඛ ප්‍රකාශන 100ක් හා සම්මානලාභීන් හඳුනාගනු ලැබීය.	-	-	-
වෙනත් වැඩසටහන්: සමාජ සුභසාධන/ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්	සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම්	සමාජ සුභසාධන වැඩසටහන් 8ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 18ක් ප්‍රකාශයට පත්කරන ලදී.	සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 21ක් ප්‍රකාශයට පත්කරන ලදී.	සමාජ සුභසාධන වැඩසටහන් 3ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 12 ක් ප්‍රකාශයට පත්කරන ලදී.	-	-	-
එකතුව					184.07	111.88	101.7

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

සංකීර්ණ ගැටලු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හෝ විසඳුම් ලබාදීම සඳහා හුදකලාවූ පර්යේෂණ මගින් හැකියාව ලැබෙනුයේ අල්ප වශයෙනි. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක් මගින් සාමාන්‍ය සීමාවන්ට පරිබාහිර ගැටලු නැවත අර්ථදැක්වීම සහ දුෂ්කර ගැටලු අලුතින් අවබෝධ කරගැනීම හරහා විසඳුම් වෙත එළැඹීමට හැකිවන පරිදි බහුවිධ විෂයයන් වෙතින් සුදුසු පරිදි දායකත්වයන් ලබා ගැනේ.

මෙම වැඩසටහන 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමගින් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ඉතා කඩිනමින් අවශ්‍ය වන, අතිශය වැදගත් අංශ දහයක් යෝජනාවී ඇත.

රජයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්ව විද්‍යාලයන්හි පර්යේෂක කණ්ඩායම් වෙතින් පූර්ව යෝජනා කැඳවන ලදී. රටේ ආර්ථික සංවර්ධනය, සමාජ සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින්, ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටලු විසඳාලීම මෙම ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා සිදුකිරීමට අපේක්ෂිතය.

ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය හෝ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුමෙහි පවතින මූලික හිඳස පියවීම, ජාතියට බාධක හෝ අභියෝග එල්ල කෙරෙන ගැටලු විසඳාලීම මෙම ව්‍යාපතිවල අරමුණු වේ. ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, නිෂ්පාදන/ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණයන්හි ප්‍රතිඵල යොදාගැනීමේ මාර්ගය සහ ඒවා භාවිතයට ගැනීම පැහැදිළිව හඳුනාගත යුතුය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (වැදගත් ක්ෂේත්‍ර දහයක්) සමඟ අනුගත වෙමින් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ලැබිණි. එක් ප්‍රදානයක වටිනාකම මිලියන 50ක් වන අතර වසර 5ක කාලසීමාවක් සඳහා මෙම ප්‍රදානයන් සිදුකරයි. ජාතික පර්යේෂණ සභාව විසින් සැලකිය යුතු මහජන මුදල් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන බැවින්, මේ සඳහා මූල්‍යනය ඉතා ඉහළ තරඟකාරී පදනමකින් සිදුකෙරෙනු ඇත. වසර 5ක කාලයකට පසු ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵලයක් ලබාදීමේ හැකියාවක් ඇති බවට ජාතික පර්යේෂණ සභාව විසින් සලකනු ලබන, ව්‍යාපෘතීන්හි කණ්ඩායමක් වශයෙන් එක්ව ක්‍රියා කළ හැකි කුසලතා සහිත, ඉතා සුදුසු පර්යේෂකයින් පමණක් තෝරාගැනීමට ජාතික පර්යේෂණ සභාව විසින් කටයුතු කෙරෙනු ඇත. පර්යේෂණයන්හි විවිධ අංශ පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමගාමීව කටයුතු කිරීමේ වාසිය මෙම බහුවිෂයයන් මත කේන්ද්‍රගත වූ ව්‍යාපෘති හරහා උදාවනු ඇත.

ප්‍රදානයෙහි මෙහෙයුම් සැලසුම් අන්වේෂක මත පදනම් වූ ප්‍රදානයන්ට සමානවේ. කෙසේ වුවද, ප්‍රධාන අන්වේෂකට අමතරව නියෝජ්‍ය කායකයෙකුද පත්කෙරෙනු ඇත. මෙම ප්‍රදාන ලබාදීමෙන් අනතුරුව, ප්‍රකාශිත ප්‍රතිඵලයන් ළඟාකරගන්නා බවට සහතික කරනු පිණිස මෙම ව්‍යාපෘතීන් විධිමත්ව හා දැඩිව නිරීක්ෂණය, සුපරීක්ෂණය සහ ඇගයීමට ලක්කරනු ඇත.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ආයතන සහ විශ්ව විද්‍යාල මගින් සිදු කෙරෙන අතර ඒ සඳහා රාජ්‍ය ආයතනික අරමුදල්, තරහකාරී ප්‍රදාන සහ පර්යේෂණ ගිවිසුම් වැනි විවිධ ප්‍රභවයන් වෙතින් අරමුදල් ලබාදේ. විද්‍යාඥයින්ට අවම පරිපාලන අවහිරතා යටතේ සිය පර්යේෂණ කාර්යයන්හි නියැලීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අරමුණින් ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබීය.

ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන මගින් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය ආයතන වලට තරගකාරී ප්‍රදානයන් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම වසර ගනනාවක් පුරා ක්‍රමවත් කර ඇති අතර දැන් එය වැඩි හෝ අඩු වශයෙන් පරිසමාප්තවේ. ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම පලකර විද්‍යාත්මක දැක්ම, ජාතික සංවර්ධනයට ඇති අදාලත්වය මත පදනම්ව ඇගයීම් කරනු ලබන අතර ප්‍රතිඵල ජාත්‍යන්තර සඟරාවල පලකරනු ලැබේ.

අයදුම්පත් ඉතා දැඩි ඇගයුම් ක්‍රියාවලියකට ලක්කරනු ලැබේ. තෝරාගත් යෝජනා සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණයෙන්ම වගකිවයුතු ප්‍රධාන අන්වේශක වෙත සෘජුවම භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදල් සඳහා වන සුදුසු මුදල් වෙන්කිරීම් කවුන්සිලය මගින් තීරණය කරනු ඇත. උපකරණ, පර්යේෂණ සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ආදිය සඳහා අරමුදල් සලකා බැලේ. එක් එක් ව්‍යාපෘතිය සඳහා බැංකු ගිණුමක් විවෘත කරන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියලු ගනුදෙනු අධීක්ෂණය කෙරේ. මෙමගින් විද්‍යාඥයින්ට අවම අවහිරතා යටතේ අරමුදල් භාවිතා කිරීම සඳහා සැලකිය යුතු නම්‍යශීලිත්වයක් ලබාදේ. කවුන්සිලය හා ජාතික පර්යේෂණ සභාවේ ලේකම් කාර්යාලය මගින් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම හා ඇගයීම සිදුකරනු ලැබේ.

වත්මන් ප්‍රදානයන් විවිධ ස්වභාවයෙන් යුතු බව මෙහිදී සඳහන් කල යුතුවේ. ශුද්ධ විද්‍යාව පිළිබඳව හා ආහාර, ජලය, පරිසරය හා බල ශක්තිය පිළිබඳ පර්යේෂණ සඳහා අරමුදල් සැපයීමට අමතරව NRC මගින් පසුව ජාතික ආවේක්ෂණය, වාරිමාර්ග පද්ධති, වන ජීවී හා පාරිසරික සංචාරක කර්මාන්තය, කථන පරිවර්තනය, ඉදිකිරීම් හා වාස්තු විද්‍යාව, දුම්රිය මාර්ග සංඥා, ක්‍රීඩා හා වෙනත් ක්ෂේත්‍ර ගණනාවක් සඳහා අරමුදල් ලබාදෙනු ලැබිය.

සියලු වැඩසටහන් සඳහා සරල නමුත් විස්තීර්ණ එක් අයදුම්පත් කට්ටලයක් ඉදිරිපත් කෙරේ. වසර ගණනාවක සිට NRC වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම ධනාත්මක ලක්ෂණයකි. මෙම වැඩසටහන සඳහා ඇති අභියෝගය වන්නේ NRC විසින් මෙතෙක් ලභාකරගෙන ඇති ප්‍රගතිය ආරක්ෂා කරගැනීමවේ.

මෙම ප්‍රදානයන්ගෙන් ඉහලම නිමවුම් ලබාගැනීම සඳහා එහි ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම සඳහා කවුන්සිලය විසින් නව නීති රීති හා මාර්ගෝපදේශ ගණනාවක් හඳුන්වා දී ඇත.

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

ජාත්‍යන්තර මට්ටමට ළඟාවූ විද්‍යාඥයින්ට ගෞරව දැක්වීම, ජාතික විද්‍යාත්මක පර්යේෂණයන් ඉහළ නැංවීම යන අභිමතාර්ථයන් පෙරදැරිව විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබිය. 1991 වසරේ සිට මේ දක්වා විද්‍යාත්මක ප්‍රකාශන එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මඟින් අනාවරණ වන්නේ ගුණාත්මක විද්‍යාත්මක ප්‍රකාශනවල සංඛ්‍යාවේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

2019 වසරේ සිට විද්‍යාඥයෙකු සඳහා තනි පුද්ගලයෙකු ලෙස නොව ප්‍රකාශන (පර්යේෂණය) සඳහා සම්මාන පිරිනමනු

ලැබේ. ප්‍රකාශන වලට අමතරව විද්‍යාවට අදාල ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර සඳහා ද සම්මාන පිරිනමනු ඇත. මූලිකවම ශ්‍රී ලංකාව තුල සංකල්පිත හා සිදුකරනු ලබන පර්යේෂණ දිරිමත් කිරීම ජාතික පර්යේෂණ සභාවේ අපේක්ෂාව වන බැවින් ජාත්‍යන්තර සහයෝගිතාවය ඇතිව පර්යේෂණ හා ප්‍රකාශන සිදුකරන අවස්ථාවලදී ශ්‍රී ලංකීය විද්‍යාඥයින් විසින් දායකත්වය දක්වනු ලබන මට්ටම පිළිබඳව සලකා බලනු ඇත.

කිසියම් විද්‍යාත්මක පර්යේෂණයක් කෙරෙහි පක්ෂග්‍රාහිවීම වැලැක්වීම සඳහා ප්‍රකාශන පෙලගැස්වීම සඳහා යොදාගනු ලැබූ ලකුණුදීමේ ක්‍රමවේදය ප්‍රමිතිකරණය කර ඇත (අදාල කරගනු ලබන නිර්ණායක පදනම්ව) ; එය විනිවිදභාවයෙන් යුතුව සිදුකරනු ලැබේ - උදා. මහජනයාට ඒ සඳහා නිදහසේ ප්‍රවේශවීමට හැකිවේ. Scopus විසින් පවත්වාගෙන යනු ලබන හා Elsevier BVට අයත් සඟරා නම් කිරීමේ දත්ත ගබඩාවක් වන SCImago Journal Rank (SJR) මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ. 2018 වසරේදී ශ්‍රේණිගත කරන ලද සඟරාවන්හි පළවූ ප්‍රකාශන 100ක්, 2020 වසර තුලදී සම්මාන පිරිනැමීම සඳහා හඳුනාගනු ලැබීය. COVID ගෝලීය වසංගතය හේතුවෙන් සම්මාන උළෙල 2021 වසර තෙක් කල්දමනු ලැබීය.

<u>රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහන</u>

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් වන ගෝලීය වෙළඳපළ තුළ තරඟකාරීත්වයන් ඇති අගය එකතු කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මග සලසනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන ප්‍රධාන කර්මාන්තයන්හි අවශ්‍යතාවන් සපුරාලන, ඉල්ලුමට සරිලන පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන පෞද්ගලික කර්මාන්ත-සහයෝගිතා (PPP) වැඩසටහන මඟින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලැබෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම මඟින් දේශීය හැකියාවන් ශක්තිමත් කිරීම සිදුකෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම් ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, අගය එකතුකිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටලු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ සියලු නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගිතාවයන් තුලින් කාර්මික පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥතාවය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩාත් ඵලදායී ලෙස හුවමාරුකර ගැනීමේ හැකියාව ලැබේ. මෙම සහයෝගිතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අඩු වනු ඇත. රාජ්‍ය අංශයේ සහයෝගිතාවය සහිත ව්‍යාපාරයක් මඟින් සිදුකරණ පර්යේෂණ හා සංවර්ධන වියදම්වලට අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - ව්‍යාපාරික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් අතර සම්බන්ධීකරණය සඳහා ජාතික පර්යේෂණ සභාව මැදිහත්වේ.

ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන වැඩසටහන

අප අනුමාන කරනවාට වඩා වැඩි වේගයකින් පර්යේෂණ පිළිබඳ අවශ්‍යතාවයන් ඇතිවේ. එය ඉතා ඉක්මනින් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් අපේක්ෂාකරන ගෝලීය වසංගතයක් හෝ ශාක වලට පැතිරී යන රෝගයක් හෝ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද හදිසි තත්වයක් විය හැකිය. ජාතික පර්යේෂණ සභාවේ සාමාන්‍ය පර්යේෂණ ප්‍රදාන වැඩසටහන් එක් වසරකට වැඩි කාල පරාසයක් සඳහා සැකසී ඇත. එබැවින්, ඉහත සඳහන් කරන ලද පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් සඳහා සහය ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාවේ කෙටි කාලීන පර්යේෂණ වැඩසටහනෙහි හිදසක් පැවතිණ. මෙම හිදස පියවීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් කාල සීමාව මාස 06ක් වන 'ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන' වැඩසටහන ලෙස හඳුන්වන කෙටි කාලීන පර්යේෂණ වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබූ අතර ප්‍රදානය කරනු ලබන උපරිම මුදල රු. 500,000/-ක් වේ.

මෙම ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන යටතේ වන පළමු කාණ්ඩයේ ප්‍රදානයන් COVID -19 ගෝලීය වසංගතය පාලනය කිරීම අරමුණු කොටගත් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් සඳහා ප්‍රදානය කරනු ලැබීය.

වෙනත් වැඩසටහන්

සුභසාධක ප්‍රදානයන්: ජාතික පර්යේෂණ සභාවේ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2020 වසරේ සිට නව පියවරක් ලෙස සුභසාධක ප්‍රදානයන් ආරම්භ කරනු ලැබීය. මෙම ප්‍රදානයන් මගින් රාජ්‍ය ආයතන වලට ආයතනය තුලම ක්ෂේත්‍ර පර්යේෂණයක් මගින් නිර්මාණය කරනු ලබන දැනුම හෝ දත්ත ගබඩා යොදාගෙන මහජනයාට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ වාසිය සැලසේ.

විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනයන් සඳහා වන ජීවිත කාලීන සම්මාන: දශකයකට වැඩි කාලයක් පුරා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයන් සඳහා ලබාදුන් කැපීපෙනෙන දායකත්වය, නායකත්වය හා සාර්ථකත්වය වෙනුවෙන් විශේෂ ඇගයීමකට ලක්විය යුතු පුද්ගලයින් ඇගයීම හා උපහාර දැක්වීම සඳහා, 2020 වසරේදී මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබීය. මෙම ජීවිත කාලීන සම්මාන ඔවුන්ගේ විශේෂඥතාවය ඇති ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන සම්බන්ධයෙන් සාර්ථකත්වයක් පෙන්නුම් කළ හා ලබාදුන් දායකත්වය ඇගයීමට ලක්කළ යුතු ශ්‍රී ලාංකිකයින්ට රජය මගින් පිරිනමනු ඇත.

2020 වසරේ විශේෂ අවස්ථා

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

2019 ඔක්තෝබර් මාසයේදී NRC විසින් 2020 වසර සඳහා නව ප්‍රදානයන් සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම් පලකරනු ලැබීය.

	2014	2016	2018	2020
ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	60	50	25	49
විස්තරාත්මක යෝජනා සඳහා කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	21	13	06	08
ලැබූ විස්තරාත්මක යෝජනා සංඛ්‍යාව	21	11	05	07
ඉදිරිපත් කිරීම් සඳහා කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	11	06	03	05
පිරිනමන ලද ප්‍රදානයන් සංඛ්‍යාව	05	03	01	01

2014, 2016 හා 2018 වර්ෂයන්හීදී පිරිනමන ලද ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ ප්‍රදානයන් නවයක් 2020 වසර තුළදී ක්‍රියාත්මකව පැවති අතර, ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක, මහාචාර්ය ආර්.බී. මාපා මහතා විසින් ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී. ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක් පිළිබඳ ව්‍යාපෘතිය නිමකරන ලද අතර මේ වනවිට ඇගයුම් කරමින් පවතී.

දැනට ක්‍රියාත්මකව පවතින ඉලක්ක මත පදනම් වූ ප්‍රදාන:

වාහකයින් පාලනය මගින් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්

(ප්‍ර:අ: ආචාර්ය මේනකා හපුගොඩ සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය නිල්මිණි ගුණවර්ධන, කැළණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, මදුරුවන්ගේ ස්වාභාවික අභිජනන වාසස්ථාන අවම කිරීම, නැනෝ තාක්ෂණය භාවිතයෙන් නිපදවූ කෘමිනාශක මගින් ප්‍රතිකර්ම කරන ලද ජනේල තිරරෙදි සහ මදුරු දැල් භාවිතයෙන් මදුරුවන් දෂ්ඨ කිරීම අවම කිරීම සහ ඩෙංගු පාලනය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩිදියුණු කිරීමවේ.



කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂී තත්ත්වය ළඟාකර ගැනීම සඳහා කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: කේ. මහීපාල මයා සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය තුසිත් සමරකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, එළදෙනුන්ගේ පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම, වඩා හොඳ ආහාර භාවිතා කිරීම, පැටවුන් බිහි කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, උපරිම ගැබ් ගැනීමේ ශීඝ්‍රතාවයක් සඳහා සමමුහුර්තකරණ ක්‍රියාවලිය භාවිතය, දින 18-20 වැනි කාලයකදී ගැබ් ගැනීම කලින්ම හඳුනාගැනීමේ අඩු වියදම් ක්ෂේත්‍ර කට්ටලයක් හඳුන්වා දීම, මැස්ටයිටිස් රෝගය සඳහා පොදු රෝග නිධාන හඳුනාගැනීම, රෝග හටගැනීම සහ ව්‍යාප්තිය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිජීවක ඇසුරෙන් ප්‍රතිකාර කිරීම සහ සත්ත්ව සුභසාධනය වැඩිදියුණු කිරීම මගින් කෘෂිකර්මාන්තය සඳහා සුදුසු සියළු දේශගුණික ප්‍රදේශවල කිරි ඵලදාව වැඩිකිරීමවේ.



ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: මහාචාර්ය අයි.බී. ගවරම්මාන සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඒ. දංගොල්ල, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

නවීන තාක්ෂණික සර්පාගාරයක් වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සර්පයින්ගේ විෂ එක්රැස් කිරීම හා විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේදී දෂ්ටනය සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේදී ප්‍රතිවිෂ නිෂ්පාදනය සඳහා අශ්වයින් යොදා ගැනෙන පර්යේෂණ සංකීර්ණයක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ වේ.



ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක්

(ප්‍ර:අ: මහාචාර්ය ආර්.එල්.ආර්.වන්ද්‍රජිත් සහ නියෝජ්‍ය ප්‍ර:අ: මහාචාර්ය ජේ.ජී.එස්.රණසිංහ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ, නිදන්ගත වකුගඩු රෝගයේ (CKDu) විවිධ ලක්ෂණ පිළිබඳ සොයාගැනීමයි. රෝගයේ ක්‍රමික වර්ධනය සහ මරණයට පත්වීම සඳහා බලපාන සාධක හඳුනාගැනීම සඳහා CKDu රෝගයෙන් පෙළෙන රෝගීන්ගෙන් ලබාගත් රුධිර සහ මුත්‍ර සාම්පල විශ්ලේෂණය කරනු ලැබේ. ICPMS යන්ත්‍රය භාවිතයෙන් රෝගය බලපෑමට ලක්ව ඇති ගිරාඳුරුකෝට්ටේ සහ විල්ගමුව යන ප්‍රදේශයන්හි ළිං, වැව් සහ කුඹුරු ආදියෙන් ලබාගත් ජල සාම්පල බැර ලෝහ සඳහා විශ්ලේෂණය කිරීම, මහවැලි ප්‍රදේශයන්හී පරිසර දූෂණය පිළිබඳ ඉතිහාසය සොයා බැලීම සඳහා GIS සිතියම්ගත කිරීම් ඇතුලුව එම ප්‍රදේශයන්හි අංගසම්පූර්ණ භූ පරිසර අධ්‍යයනයක් සිදුකරනු ලැබූ අතර මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.





ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම

(ප්‍ර:අ: ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඩී.එම්.ජේ.බී. සේනානායක, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම)

අධික උෂ්ණත්වයන්, ජල හිඟයට ඔරොත්තු දෙන, වැඩි ඵලදාවක් සහිත පළිබෝධ සහ රෝග සඳහා ඔරොත්තු දෙන/ප්‍රතිරෝධී මිරිස්, බඩඉරිඟු, මුං බීජ සහ සහල් ප්‍රභේද වැඩිදියුණු කිරීම, විවිධ දේශගුණික තත්ත්වයන්ට යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් යෝජනා කිරීම; පාංශු තෙතමන දර්ශක භාවිතයෙන් නියහයන්ට ලක්වීමේ වැඩි අවදානමක් සහිත ප්‍රදේශ හඳුනාගැනීම සහ සිතියම්ගත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණුවේ.



ප්‍රමාණවත් ඵලදාවක් පවත්වා ගනිමින් සහ පාංශු සාරවත්භාවය වර්ධනය කරගනිමින් අකාබනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී වගා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම.
(ප්‍ර:අ: ආචාර්ය සමන් ධර්මකීර්ති, ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ වී වගාවේදී රසායනික පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ එමගින් රටෙහි රසායනික පොහොර භාවිතය අවම කිරීම සඳහා පරිසර හිතකාමී සහ ගොවිජන හිතකාමී තාක්ෂණයන් වැඩිදියුණු කිරීමය. එමෙන්ම, ශාකවල මනා පැවැත්ම වැඩිදියුණු කිරීම හා වී වගා බිමෙහි වෙනත් කෘෂි රසායන භාවිතය අවම කිරීම සඳහා මෙම තාක්ෂණයන් ඵලදායී ලෙස යොදාගැනීම පිළිබඳව සොයාබැලීමද මෙමගින් අපේක්ෂිතය. පෞද්ගලික අංශයේ ආයෝජකයින් සමඟ ඇති කරගනු ලබන සහයෝගිතාවයන් හරහා මෙම වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් ගොවීන් වෙත හඳුන්වා දෙනු ඇත.



භූගත ජලයේ දියවී ඇති සමස්ත ඝන ද්‍රව්‍ය සහ ෆ්ලුවොරයිඩ් සඳහා ප්‍රතිකර්ම යෙදීමේ පහසුකමක ආකෘතියක් වැඩිදියුණු කිරීම - වියළි කලාපීය පානීය ජල ගැටලුව සඳහා තිරසර විසඳුමක්
(ප්‍ර:අ: මහාචාර්ය රොහාන් වීරසූරිය, ආචාර්ය එස්.කේ. වේරගොඩ, ජාතික මූලික අධ්‍යයන ආයතනය)

වියළි කලාපයේ ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් පැන නැඟ ඇති ගැටලු සඳහා තිරසර විසඳුමක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ විද්‍යුත් ආතංචනය (electro-coagulation) සහ නිනිති පටල පෙරීමේ ක්‍රමය (nano membrane filtration) යොදා ගනිමින් ජලයේ අඩංගු අතිරික්ත ෆ්ලුවොරයිඩ සහ සමස්ත දියවූ ඝන ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය සහිත ජංගම ප්‍රතිකර්ම පහසුකමක් තැනීමට යෝජිතය. මෙම යෝජිත ජල ප්‍රතිකර්ම ආකෘතිය ආරම්භයේදී කුඩා ගම්මානයක් සඳහා සීමාවනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ (NWSDB) පාලනය යටතේ, ජල ප්‍රභවය ආසන්නයේ පදිංචි ග්‍රාමීය පාරිභෝගිකයන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා මෙම පිරිසිදු ජලය බෙදාහැරීම සිදුකෙරෙනු ඇත. ජල හිඟයෙන් පීඩා විඳින ප්‍රජාවන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමේ අත්‍යාවශ්‍ය පළමු පියවරක් මේ හරහා තැබෙනු ඇත.



ජල පවිත්‍රකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම්වූ පෙරහන් වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: මහාචාර්ය රෝහිණී ද සිල්වා, මහාචාර්ය නලින් ද සිල්වා, කොළඹ විශ්ව විද්‍යාලය)

ජල පවිත්‍රකරණ ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය ප්‍රජාව වෙත විදුලිය අවශ්‍ය නොවන, අඩු වියදම් සහ ඵලදායී ජල පෙරහනක්, සපයාදීම මෙහි මූලික අරමුණවේ. මෙම තිරසර ජල පවිත්‍රකරණ පද්ධතිය දේශීය නිෂ්පාදකයෙකු විසින් නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙහි නිර්මාණය කර ඇති බහුවිධ පද්ධතීන් මගින් බැක්ටීරියා, කාබනික දූෂක ද්‍රව්‍ය, බොර පැහැය, බැරලෝහ සහ අනෙකුත් අකාබනික දූෂක ද්‍රව්‍ය ඉවත් කෙරෙනු ඇත.



දූෂණය පාලනය කිරීම හා අගය එකතුකිරීම සඳහා මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් සඳහා විස්තීර්ණ විසඳුමක්

(ප්‍ර.අ: මහාචාර්ය මෙත්තිකා විතානගේ, ආචාර්ය බී.සී. එල්. අතපත්තු මිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

නාගරික කාබනික සහ අපද්‍රව්‍ය කාබනීකෘත ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීම සඳහා - මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් කළමනාකරණය සඳහා තිරසාර විස්තීර්ණ විසඳුමකි.



ශ්‍රී ලංකාවේ තෝරාගත් ඖෂධීය ශාක මගින් දියවැඩියාව හා රුධිරගත අධික මේදය යන රෝගී තත්වයන් සඳහා නව බහුශාකසාර සංයුතියක් නිපදවීම.

(ප්‍ර.අ: ආචාර්ය ජේ.එම්.එස්.ජේ.මැණිකේ, නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය කේ.ජී.ඒ.පී.අත්තනායක)

පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 දෙසැම්බර් මස අවසානයේ මෙම ප්‍රදානය පිරිනමනු ලැබීය;

- ප්‍රමිතියෙන් යුත් විශ්ලේෂණ ක්‍රම භාවිතාකර කරපිංචා කොළ, සුදු ලූණූ, ගම්මිරිස් ඇට හා ගොරකා ගෙඩි අඩු උෂ්ණත්වයක් යටතේ වියලා (freeze dried) ලබාගත් කුඩු වලින් සමන්විත බහුශාකසාර සංයුතිය ප්‍රමිතිකරණය.
- බහුශාකසාර සංයුතියේ ස්ථායිතාවය, කල්තබා ගත හැකි කාලය හා ඖෂධ ශරීරය තුල ගමන් කරණ ආකාරය තීරණය කිරීම.
- බහුශාකසාර මිශ්‍රණයේ ආසන්නතම පෝෂණ සංයුතිය තීරණය කිරීම.
- 2 වන ආකාරයේ දියවැඩියා තත්වය සහිත රෝගීන්ගේ රුධිරගත ග්ලූකෝස් මට්ටම අඩුකිරීම කෙරෙහි බහුශාකසාර සංයුතියේ බලපෑම තීරණය කිරීම.
- ඉහත අධ්‍යයන මාතෘකා වල සඳහන් බහුශාකසාර සංයුතියේ අහිතකර/විෂ සහිත බලපෑම තීරණය කිරීම.
- 2 වන ආකාරයේ දියවැඩියා තත්වය සහිත රෝගීන් සඳහා ඔක්සිකරණ ආතති සාධක හා ප්‍රදාහයක් ඇතිවීමේ සාධක, රුධිරගත අධික මේදය කෙරෙහි බහුශාකසාර සංයුතියේ බලපෑම විමර්ශනය කිරීම.
- ඉහත විශ්ලේෂක පාදක මූලධර්ම භාවිතයෙන් බහුශාකසාර සංයුතියේ ප්‍රති දියවැඩියා ද්විතීක පරිවෘත්තජ හඳුනා ගැනීම.
- හඳුනාගත් සංයෝග සඳහා කෘතිම වෙනස්කම් සිදුකර ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය අතර සම්බන්ධතාවයක් ගොඩනැගීම.
- ස්ට්‍රෙප්ටොසොටොසින් මගින් 2 වන ආකාරයේ දියවැඩියාව ඇතිකල මීයන්ගෙන් වෙන්කරගත් සංයෝගයන්හි වැඩිදියුණුවූ සෛලීය ප්‍රතිදියවැඩියා යාන්ත්‍රණයක් විමර්ශනය කිරීම.
- ස්ථූල විස්ටර් රැට් මොඩලය (Wistar rat model) මගින් දියවැඩියාවට එරෙහිව බහුශාකසාර මිශ්‍රණයේ ආරක්ෂාකාරී බලපෑම විමර්ශනය කිරීම
- බහුශාකසාර සංයුතිය වාණිජකරණය සඳහා ඇති හැකියාවන් පිළිබඳව සොයාබැලීම.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන

ජාතික පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම්වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන සඳහා ලැබී තිබූ අයදුම්පත් සමගින් 2020 වසර ආරම්භ විය. සියළුම විශ්ව විද්‍යාල, පීඨයන් සහ රජයේ සියළුම පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර සංසරණය කරන ලද පුවත්පත් දැන්වීමක් හරහා පර්යේෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබීය.

අයැදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019 නොවැම්බර් 11 වූ අතර අයැදුම්පත් 133ක් ලැබී තිබුණි. පළමු කාර්තුව තුළදී දැනට ක්‍රියාත්මක ප්‍රදානයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තාවන් ඇගැයීම් සඳහා යවන ලදී.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුත් ඇගැයීම්කරුවන් වෙත මෙම අයැදුම්පත් (2019) යවනු ලැබිණි. කවුන්සිලය මගින් සාකච්ඡා මණ්ඩල හරහා තවදුරටත් අයැදුම්පත් පරීක්ෂාවට ලක්කොට ඉහළ මට්ටමේ විද්‍යාත්මක වටිනාකමක් සහ ජාතික අදාලත්වයක් පෙන්නුම් කෙරෙන අයැදුම්පත් තෝරාගනු ලැබිණි.

ක්‍රියාකාරකම	**2018**	**2019**	**2020**
ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා තෝරාගත් අයැදුම්පත් සංඛ්‍යාව	24 + 4	37	38
මූල්‍යනය කරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව	24 + 4	32	15
භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා පිරිනමනු ලැබූ ප්‍රදානයන්හි මුළු වටිනාකම	රු.මිලි. 120.93	රු.මිලි. 148.01	රු.මිලි. 47.49

2020 වසර තුල ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් අතරින් 28.6%ක් (38/133) පමණක් තෝරාගනු ලැබූ අතර අයැදුම්පත් 37ක් මූල්‍යනය සඳහා මහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී. 2020 වසර අවසානය වනවිට තෝරාගත් අයදුම්පත් 37 අතරින් එක් අයදුම්පතක් කවුන්සිලයේ තීරණය අපේක්ෂාවෙන් පසුවිය.

මෙම වර්ෂය තුළදී, 2020 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් ඇසුරෙන් පර්යේෂණ ප්‍රදාන 15ක් මූල්‍යනය කරනු ලැබූ අතර එම ප්‍රදානයන්හි කටයුතු ආරම්භ කෙරිණි. වර්ෂය අවසානයේදී, ප්‍රදානයන් 38ක් සඳහා ඇගැයීම් සම්පූර්ණ කරනු ලැබ තිබිණි.

2020 දී මූල්‍යනය කරන ලද පර්යේෂණ ප්‍රදාන

අයදුම්පත් අංකය	ප්‍රධාන අන්වේෂක හා ආයතනය	මාතෘකාව
20-007	ආචාර්ය එන්.සී.එස්. රුක්ලානි පශ්චාද් ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Investigation of the potential use of bryophytes as climate change indicators
20-010	මහාචාර්ය ඩබ්.ඒ.අයි.පී. කුලරත්න සත්ව විද්‍යා අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Shift in species composition and diversity of bee pollinators and natural enemies while enhancing crop yield in a highly dynamic agro-natural landscape
20-014	ආචාර්ය සී.එච්. මනෝරත්න ද්‍රව්‍ය තාක්ෂණ අංශය කාර්මික තාක්ෂණ ආයතනය	A stable composite based on titanium dioxide and clay as an effective photocatalyst for wastewater treatment
20-039	ආචාර්ය එස්.ඒ. සෙනෙවිරත්න භෞතික විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය	Tunable biodegradable polymers and polymeric nanocomposites from locally available renewable sources
20-066	වෛද්‍ය ඩී.එම්.ඒ.බී. දිසානායක ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යයන අංශය වෛද්‍ය පීඨය කැලණිය විශ්ව විද්‍යාලය	An attempt to in vitro differentiation of human round spermatids into mature spermatozoa (spermiation)

20-074	ආචාර්ය ජේ.ඒ.ඒ.සී. විජේසිංහ ජෛව පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය	Characterization of a composite flour from Kithul (Caryota urens) and arrowroot (Marantha arundinacea) flour with different modifications to widening its applications in food industry.
20-078	වෛද්‍ය ඒ. මුරුගනාදන් ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශය වෛද්‍ය පීඨය යාපනය විශ්ව විද්‍යාලය	Clinico-epidemiology, coagulation profile and the phylogenetic positioning of Saw-scaled viper in Northern Sri Lanka.
20-080	ආචාර්ය එච්.එම්.වයි.සී.මල්ලිකාරච්චි සිවිල් අධ්‍යයන අංශය මොරටුව විශ්ව විද්‍යාලය	Simulation of self-deployable structures made of ultra-thin shells
20-083	මහාචාර්ය ආර්.එස්. රාජකරුණා සත්ව විද්‍යා අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Canine tick borne infections: reservoirs, tick vectors and zoonotic disease risk of rickettsial infections
20-085	ආචාර්ය එස්.ඒ. වීරසූරිය කෘෂිකාර්මික ආර්ථික විද්‍යා හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Household Food Waste Behaviors and Implications for Food Security and Environmental Sustainability in Sri Lanka.
20-086	ආචාර්ය ජේ.ඒ.ටී.සී. ආරියසේන රසායන විද්‍යා අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Determination of Descriptor Values for Selected Volatile Constituents in Cinnamon, in order to Determine their Distribution Levels in Environmental Compartments
20-108	ආචාර්ය ආර්.ඒ.එම්.පී. රණවීර යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය මොරටුව විශ්ව විද්‍යාලය	Development of a cooling system to reduce the temperature generation in conventional spice grinding machines through experimental investigation of the temperature distribution inside the grinding chamber of conventional spice grinding machines
20-117	ආචාර්ය එස්.එස්.ආර්.එම්.ඩී.එච්.ආර්. විජේසේකර ස්වභාවික සම්පත් අධ්‍යයන අංශය ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය	Microplastics Bound Transport and Differential Bioavailability of I Pharmaceuticals, Personal Care Products (PPCPs) and Toxic Trace Elements in Water
20-123	ආචාර්ය එම්.ඒ.බී.රණතුංග ශාක අභිජනන අංශය ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය	Conservation and Utilization of Old Seedling Teas: A Viable Option for Adaptation to Climate Change
20-124	ආචාර්ය එන්.කේ.ජයසූරිය පශ්චාද් ආචාර්ය උපාධි අධිශීෂ්‍යත්ව මොරටුව විශ්ව විද්‍යාලය	Determination of Optimum Characteristics of Feeder Service for a Public Transit Route


Distribution of Grants Among Different Research Disciplines -2020
8
7
6
5
4
3
2
1
0
25.00
20.00
15.00
10.00
5.00
0.00
Medical Sciences
Agriculture
Engineering & IT
Chemistry, Environment & Other
No of Awarded Grants
Amount Awarded (Rs. Millions)


විවිධ සංවර්ධන අරමුණු සඳහා අන්වේශක මත පදනම් පර්යේෂණයන්හි ව්‍යාප්තිය -2020
48%
44%
3%
5%
ධාරිතා වර්ධනය (උපකරණ + පරිහරණ ද්‍රව්‍ය)
මානව සම්පත් කළමනාකරණය (භෘතිකාව)
වෙනත් (ගමන් වියදම්)
දැනුම බෙදාහැරීම (ප්‍රකාශන ගාස්තු)

විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මාන

COVID-19 වසංගතය හේතුවෙන් රජය විසින් මහජන ඒකරාශීවීම් සඳහා අවසර ලබා නොදුන් බැවින් මහජන සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ මාර්ගෝපදේශ අනුගමනය කරමින් කවුන්සිලයේ තීරණය අනුව විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මාන උළෙල 2021 වර්ෂය තෙක් කල්දමනු ලැබීය.

කෙසේවුවද, ශ්‍රී ලාංකීය ආයතනයකට අනුබද්ධ ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් 20%කට වැඩි දෙනෙකුගේ ලිපි පළකරනු ලබන SCImago සඟරා ශ්‍රේණිගත කිරීම අනුව (SJR) ඉහලම ස්ථානයක ශ්‍රේණිගත කරන ලද සඟරාවල පළවූ ප්‍රකාශන අතරින් හඳුනාගනු ලැබූ ප්‍රමුඛ ප්‍රකාශන 100 ලබන වසරේ සම්මාන උළෙල සඳහා ලයිස්තු ගතකර ඇත. මෙම විද්‍යාඥයින් වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හා කෘෂිකර්මය ඇතුලු විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලැබේ.

රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා (PPP) වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

ක්‍රියාකාරකම්	2018	2019	2020
PPP සඳහා ලද අභිමතයන් පළකිරීම් (EOI) සංඛ්‍යාව	15	7	6
විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් EOI සංඛ්‍යාව	7	5	4
පෞද්ගලික අංශය සමග ඇතිකර ගත් සහයෝගීතාවන් සංඛ්‍යාව	3	1	2 (අවසන් තීරණ අපේක්ෂිතව ඇත)
අවශ්‍ය මුළු අරමුදල් ප්‍රමාණය	රු.මිලි. 20.26	රු.මිලි. 42.23	රු.මිලි. 47.70
පෞද්ගලික අංශය මගින් සපයනු ලැබූ මුදල (දළ වශයෙන් 50%)	රු.මිලි. 10.13	රු.මිලි. 21.90	රු.මිලි. 23.85 (සැපයිය යුතුව ඇත)

දැනට ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවයන් .....

ප්‍රදාන අංකය	පර්යේෂණ සහකරු	ව්‍යාපෘතියේ මාතෘකාව
PPP 16-03	ආර්.එම්. ධර්මදාස මහතා කාර්මික තාක්ෂණ ආයතනය	Extraction and formulation of plant protection products from endemic plants for healthy growth of crops free from sucking insects (mealybugs, aphids, whiteflies and thrips) causing yellowing, wilting and leaf-curl
PPP 17-01	මහාචාර්ය එන්.කේ.බී. අදිකාරම් ජාතික මූලික අධ්‍යයන ආයතනය	Study of some post-harvest diseases and disorders that adversely affect the export potential of mango var. TomEJC and their management
PPP 17-03	ආචාර්ය කුට්ටිල ගුණසේකර මොරටුව විශ්ව විද්‍යාලය	Cross platform for Annotations in Mobile Tablets
PPP 18-01	ආචාර්ය ජේ.සී.පී.එච්. ගමගේ මොරටුව විශ්ව විද්‍යාලය	Development of an economical insulation system for externally strengthened FRP/Concrete composites using locally available materials
PPP 18-02	මහාචාර්ය රොහාන් මුණසිංහ මොරටුව විශ්ව විද්‍යාලය	Development of commercial prototypes of multipurpose drones – CeyGull and CeyBell
PPP 18-07	ආචාර්ය ගෝඛිනාස් ධර්මරාජා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය	A composition and method of seepage control using fibrous material
PPP 19-04	මහාචාර්ය නිල්වලා කෝට්ටෙගොඩ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	Waste Coconut Coir Based Multi-purpose Nano-water Filters

2020 වසරේදී නිමකරන ලද PPP ව්‍යාපෘති ...

PPP 14-08: ස්වභාවික රබර් හා පොලිඑතිලීන් යොදාගනිමින් සම්ප්‍රදායික සෙවිලි තහඩු සඳහා ආදේශකයක්

(ආචාර්ය ශාන්ත වල්පලගේ, මොරටුව විශ්ව විද්‍යාලය)



මෙම ව්‍යාපෘතිය මගින් ඉවතලන ස්වභාවික රබර් හා පොලිඑතිලීන් යොදාගනිමින් නව සෙවිලි තහඩු සඳහා භාවිතාකළ හැකි ද්‍රව්‍යයක් නිපදවීම හරහා පරිසර හිතකාමී විසඳුමක් හඳුන්වාදී ඇත. සෙවිලි තහඩුවල විශිෂ්ඨම භෞතික ලක්ෂණ සඳහා අවශ්‍ය ප්‍රශස්ත රබර් හා පොලිඑතිලීන් මිශ්‍ර කිරීමේ අනුපාතය සොයාගනු ලැබීය. මෙම සාම්ප්‍රදායික සෙවිලි තහඩු සඳහා විකල්පයක් වනු ඇති අතර පර්යේෂණය කණ්ඩායම විසින් නිපදවන ලද විවිධ වර්ගයේ සෙවිලි තහඩු ද්‍රව්‍ය වල සාම්පල මෙහි පෙන්වා ඇත.

PPP 16-05: සලකුණු නොමැති ඝන ටයර් (non-marking solid tires) සඳහා වන ස්වභාවික රබර් සංයෝගයේ විද්‍යුත් සන්නායකතාව වැඩිදියුණු කිරීම සඳහා නිනිති ද්‍රව්‍ය

(ආචාර්ය එන්.එම්.එස්.සිරිමුතු, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)







මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ නිනිති ද්‍රව්‍ය එක්කිරීම මගින් ඝන ටයර් සඳහා විද්‍යුත් සන්නායකතාවය සහිත කළු නැති ස්වභාවික රබර් සංයෝගයක් සෑදීමයි.

පර්යේෂණ කණ්ඩායමට ක්ෂාරීය ලෝහ ලවණ සමගින් කාබන් පදනම් නිනිති ද්‍රව්‍ය එක්කිරීම මගින් ඝන ටයර් සඳහා ප්‍රතිස්ථිතික ස්වභාවික රබර් සංයෝගයක් සෑදීමට හැකිවී ඇත.

නව නිෂ්පාදනය සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

PPP 16-07: වන දිගු කොළ හා දිගු සිහින් වයර් වැනි (long leafy & wiry type) තේ ශ්‍රේණිගතකිරීම සඳහා බහු දැල් රාමුවලින් සමන්විත ස්වයං පවිත්‍රකරණ පෙනේරයක් වැඩිදියුණු කිරීම

(ජී.එල්.සී. ගලහිටියාව මයා, සී. මුණසිංහ මයා, තේ පර්යේෂණ ආයතනය)



ශ්‍රී ලංකාවේ ඇති තේ කර්මාන්ත ශාලා 710 අතරින් 450කම ඉතා දීර්ඝ ක්‍රියාවලියක් මගින් තේරීමට අවශ්‍ය වන දිගු කොළ හා දිගු සිහින් වයර් වැනි (long leafy & wiry type) විශේෂ සම්මත තේ කොළ ශ්‍රේණි (වාර්ෂික තේ නිෂ්පාදනයෙන් 70%) නිෂ්පාදනය කෙරේ.

වර්තමානයේ තේරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා තේ කර්මාන්ත ශාලාවල විවිධ ප්‍රමාණයේ සිදුරු සහිත ‘Michie’ පෙනේර හතරක් උපයෝගි කරගනී.

මෙම ව්‍යාපාතිය මගින් සියලු දැල් වර්ග එකට එක්කර එක් යන්ත්‍රයක් සැලසුම්කර වැඩිදියුණුකර ඇති අතර ස්වයං පවිත්‍රකරණ යාන්ත්‍රණය යොදාගැනීම නිසා දැලෙහි හිරවන කොටස් අතින් පිරිසිදු කිරීම අවශ්‍ය නොවේ.

මෙහිදී තේ කොළ වල තත්වය වැඩිදියුණු කරන අතර ශ්‍රම අවශ්‍යතාවය අඩුවන බැවින්, නිෂ්පාදන පිරිවැය අවම කෙරේ.

රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහනෙහි නව ආරම්භයන්



විද්‍යාත්මක ප්‍රජාව හා කර්මාන්ත/ ව්‍යාපාර අතර සෘජුවම විද්‍යාත්මක පර්යේෂණ හා තාක්ෂණික සහයෝගිතාවය ඇතිකිරීම හා වෙළඳපල අවස්ථාවන් වැඩිදියුණු කිරීම සඳහා 2020 දෙසැම්බර් 10වන දින ජාතික පර්යේෂණ සභාව (NRC) හා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය (NCCSL) අවබෝධතා ගිවිසුමකට (MoU) ඇතුලත්වනු ලැබීය.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැඩිදියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර දේශීය හා විදේශීය වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා දිවයින පුරා ව්‍යාපාරයන්ට සේවාව හා සහය සැපයීමේ ප්‍රමුඛතම ආයතනය වීමේ දැක්ම ඇතිව 1948දී ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය ස්ථාපනය කරනු ලැබීය.



National Chamber signs MoU with National Research Council of Sri Lanka

'Leg Bus

The National Chamber of Commerce of Sri Lanka and National Research Council (NRC) of Sri Lanka entered into a memorandum of understanding (MoU) recently.

The purpose of this MoU is development of scientific research and technology cooperation directly between the scientific community and industries, enterprises and research and development of market opportunities.

The Public Research and Development Private Industry-Partnership (PPP) programme is to build on local strength by networking key players in R&D activities and industries to contribute towards the economic development of the country. Promoting R&D in science and technology should lead to economic development by way of increasing exports, diversifying exports and promoting import substitutes.

All innovative research leading to the development of new or better products, processes, services, value addition and solving technical problems with commercial potential will be considered for this programme. Meaningful partnerships between the different sectors will enable NRC to serve more effectively to develop solutions for industry R&D needs.

The partnerships will also improve efficiency of public R&D activities and reduce the time horizon. The private sector participation is encouraged by providing tax concessions in relation to R&D expenditure undertaken by an enterprise with public sector partnership.

The NRC will interface between government - local institute - ministries - university - R&D institutes - corporate sector - SME sector, in providing research-based solutions to national needs.

National Chamber President Asela de Livera (second from right) and National Research Council Chairman Prof. Hemantha Dodangoda (second from left) exchange the MoU after signing in the presence of National Chamber Deputy President Deepal Nelson (right) and National Research Council Chief Executive Officer Manisha Rajapaksa (left)

මෙම සහයෝගිතා වැඩසටහන යටතේ ව්‍යවසායන් විශාල සංඛ්‍යාවකට පහත දැක්වෙන සේවාවන් සැපයීමට ජාතික පර්යේෂණ සභාව සැලසුම් කරයි;

- නව නිෂ්පාදනයක් හෝ සේවාවක් ලෙස වැඩිදියුණු කළහැකි නවෝත්පාදන අදහස් සහිත ව්‍යවසායන් සඳහා තාක්ෂණ හා ආර්ථික ශක්‍යතාවය තක්සේරු කිරීම, මූල්‍යයනය කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම එම නවෝත්පාදන අදහසෙහි ප්‍රතිඵල භාවිතයට ගැනීම සඳහා ජාතික පර්යේෂණ සභාවේ සහය ලබාදිය හැකිවේ.
- තවද, නවෝත්පාදන සංකල්පයේ රහස්‍යභාවය පවත්වා ගනිමින් සුදුසු පර්යේෂණ සහකරුවකු (අවශ්‍ය වන්නේ නම්) තෝරාගැනීම සඳහාද NRC සහය ලබාදිය හැකිවේ.
- යෝජිත ව්‍යාපෘතියේ ශක්‍යතාවය මත පදනම්ව රු.මිලි.40ක උපරිමයක් දක්වා ව්‍යාපෘති පිරිවැයෙන් 50%ක වියදම NRC විසින් දරනු ඇත (කොන්දේසි වලට යටත්ව). අවසානයේ ව්‍යවසායකයා විසින් රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා (PPP) ව්‍යාපෘතියක් තුලින් නවෝත්පාදන නව නිෂ්පාදනය, වැඩිදියුණු කරනලද නිෂ්පාදනයක් හෝ සේවාවක් හෝ අගය එක්කළ වාණිජකරණය කරන ලද නිෂ්පාදනයක් නිපදවීමේ ඔහුගේ/ඇයගේ අරමුණ ඉටුකරගනු ඇත.

COVID-19 පාලනය කිරීමේ විද්‍යාත්මක මැදිහත්වීම් පිළිබඳව ගවේෂණය කිරීම සඳහා වන විශේෂ පර්යේෂණ ප්‍රදානයන් ලෙස පළමු ප්‍රදානයන් කට්ටලය පිරිනමනු ලැබීය.



COVID-19 ආසාදනයවීම හා පැතිරීම වැලැක්වීමේ සායනික පර්යේෂණ, හෝ කිසියම් නිෂ්පාදනයන්, සංකල්පයක් හෝ වෙනත් නවෝත්පාදනයන් සඳහා වන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා රජයේ විශ්ව විද්‍යාල හා රජයට අයත් පර්යේෂණ හා සංවර්ධන ආයතනවලට අනුබද්ධ පුද්ගලයින් වෙතින් පර්යේෂණ යෝජනා කැඳවනු ලැබිය. අනාගතයේදී කිසියම් දිනක පැන නැගිය හැකි COVID-19 වැනි ඕනෑම වසංගතයකදී ක්‍රියාත්මක කළහැකි සෑම කාලයකටම සුදුසු විසඳුම් මගින් වෙනත් අමතර වාසි ගෙන දෙනු ඇතැයි පැවසේ.

මාස හයක් ඇතුලත අපේක්ෂිත ප්‍රතිඵල ලබාදීමේ පොරොන්දුව මත යෝජිත ව්‍යාපෘති මාස 6ක කාලසීමාවක් සඳහා සීමාවේ. එක් ව්‍යාපෘතියක් සඳහා වන සම්පූර්ණ වියදම රු.200,000/- සිට රු.500,000 අතර වෙනස්වේ. මූලික යෝජනාවේ අපේක්ෂිත නිමවුම කාලීනව ලභාකරගැනීම පදනම් කරගෙන ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කිරීම හා අමතර මූල්‍යාධාර සැලසීම පිළිබඳව සලකා බලනු ලැබීය. නිමවුම්හි හදිසි අවශ්‍යතාවය හේතුවෙන් දැනට සිදුකරමින් පවතින යම් පර්යේෂණයක් සඳහා NRC මගින් මූල්‍යාධාර කොටසක් ලබාදීම පිළිබඳව ද මෙම වැඩසටහනේදී සලකා බලන ලදී.

COVID හා සම්බන්ධ සංචරණ සීමා හේතුවෙන් සම්පූර්ණ තෝරාගැනීමේ ක්‍රියාවලියම (අයදුම්පත් කැඳවීමේ සිට අයදුම්කරුවන්ට ප්‍රතිඵල දැනුම්දීම දක්වා වන) මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ සිදුකරනු ලැබීය. පළමු පියවර සඳහා අයදුම්පත් 35ක් ලැබුණු අතර 2020 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති නවයක් සඳහා මූල්‍යාධාර ලබාදෙනු ලැබීය. මූල්‍යාධාර සපයනු ලැබූ ව්‍යාපෘති පහත දක්වා ඇත;

ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා හා ආයතනය	මාතෘකාව
CVD 20-03	ආචාර්ය ප්‍රියමාලි ජයසේකර කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	Knowledge Attitude and Practices among healthcare workers on treating suspected/ PCR positive COVID-19 patients in Sri Lanka
CVD 20-05	මහාචාර්ය වන්දන ජයරත්න කොළඹ විශ්ව විද්‍යාලය	Development of a mobile mobile-based contact tracing and tracking mobile application (App) SWARAKSHA to mitigate COVID-19 and similar pandemics
CVD 20-07	ආචාර්ය ගයා විජයරත්න රුහුණු විශ්ව විද්‍යාලය	COVID-19 surveillance in the Southern Province of Sri Lanka
CVD 20-08	ආචාර්ය එන්.පී.වීරසිංහ රුහුණු විශ්ව විද්‍යාලය	Seroprevalence of COVID-19 in a subset of community in Sri Lanka and the possible exposure to risk factors
CVD 20-09	ආචාර්ය ආර්.එම්.එන්.ඒ.විජේවර්ධන ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය	Development and quality evaluation of the immune booster food formulation as a nutrient supplement for the people affected COVID- 19
CVD 20-12	මහාචාර්ය එෆ්. නූර්ඩීන් පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Development of a cost-effective and rapid molecular diagnostic protocol for the detection of COVID-19
CVD 20-13	ආචාර්ය කේ. අරුලනන්දෙම් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය	Innovative Photosensitive-Electromagnetic Device to find a suitable energy field, with appropriate parameters that are able to kill or deactivate viruses and improve the immune systems.
CVD 20-24	වෛද්‍ය සිසිර පතිරණ IBMBB - කොළඹ විශ්ව විද්‍යාලය	Proof of principle for development of an antigen detection rapid diagnostic test for the diagnosis of SARS-COV-2 infections
CVD 20-34	මහාචාර්ය මන්දික විජේරත්න කොළඹ විශ්ව විද්‍යාලය	A wearable hand sanitizer pocket

2020 වසරේ සුභසාධක වැඩසටහන්

1. INNOTECH ප්‍රදර්ශනය

ජාතික පර්යේෂණ සභාව (NRC), 2020 මාර්තු 11 දින සිට 13 දින දක්වා හෝමාගම පිටිපන පැවති INNOTECH ප්‍රදර්ශනය සඳහා සහභාගි විය.

NRC විසින් ස්නායු තාක්ෂණය හා රොබෝ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඩ්‍රෝන තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, අපද්‍රව්‍ය කලමනාකරණය හා ජලය වැනි වෙනත් විද්‍යාවන් හා අදාල විවිධ පර්යේෂණයන්හි ප්‍රතිඵල සමගින් ප්‍රදර්ශනයේ ස්නායු තාක්ෂණ කලාපය ආවරණය කරනු ලැබීය.

සාමාන්‍ය මහජනතාව, පාසල් ශිෂ්‍යයින් විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ඇතුලු 100,000කට වැඩි පිරිසක් තම දැනුම වැඩිදියුණු කරගැනීම සඳහා NRC තාක්ෂණ කලාපය නැරඹීමට පැමිණියහ.



2. COVID-19 වසංගතය පාලනය කිරීම සඳහා ජංගම දුරකථන පාදක කරගත් ඇප් එකක් (‘SWARAKSHA’ “ස්වාරක්ෂා (ස්ව + ආරක්ෂා)”) හඳුන්වාදීම සඳහා පැවැත්වූ මාධ්‍ය නිවේදන නිකුත් කිරීම

2020 ජූනි 24දින ජාතික පර්යේෂණ සභාවේදී පැවති මාධ්‍ය නිවේදන නිකුත් කිරීම

ජාතික හා කාලීන වශයෙන් වැදගත් කෙටි කාලීන පර්යේෂණ ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සැපයීම පිණිස NRC විසින් ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන ලෙස හැඳින්වෙන විශේෂ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබීය. COVID-19ට එරෙහිව සටන් කිරීමේ විද්‍යාත්මක මැදිහත්වීම් පිළිබඳව ගවේෂණය කිරීම සඳහා වන විශේෂ පර්යේෂණ ප්‍රදානයන් ලෙස පළමු ප්‍රදානයන් කට්ටලය පිරිනමනු ලැබීය. එකී ප්‍රදානයන්ගෙන් එකක් කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ තාරකා විද්‍යා හා අභ්‍යවකාශ විද්‍යා ඒකකයේ මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂකයින් කණ්ඩායමක් වෙත ලබාදෙනු ලැබූ අතර එම කණ්ඩායම විසින් COVID -19 වසංගතය පාලනය කිරීම සඳහා “ස්වාරක්ෂා” යනුවෙන් නම්කරන ලද ජංගම දුරකථන පාදක කරගත් ඇප් එකක් නිර්මාණය කරනු ලැබීය. 100%ක්ම ශ්‍රී ලාංකීය නිපයුමක් වන මෙම ඇප් එක මහජනයාට නොමිලේ බාගත කිරීම කල හැකිය. එමගින් තොරතුරුවල රහස්‍යභාවය සමගින් තත් කාලීන තොරතුරු සැපයේ.

සෞඛ්‍ය බලධාරීන් විසින් දත්ත ඇතුලත් කළවිට මෙම ඇප් එක ක්‍රියාත්මකව තබා සාමාන්‍ය මහජනයාට වැඩි බියක් නොමැතිව ඕනෑම ස්ථානයකට ගමන් කිරීමට හා ආර්ථික කටයුතුවල නියලීමට හැකිවේ. ඔබ පහත සඳහන් පුද්ගලයින් වෙත ප්‍රවේශවූ විට මීටර් 10ක දුරකදී ඔබගේ දුරකථනය බීප් බීප් ශබ්දයක් නැගීම, කම්පනය වීම (vibrates) සිදුවන අතර ඔබ වෙත ලභාවන පුද්ගලයාගේ අවදානම් මට්ටම වෙනස් වර්ණ 5ක් මගින් තිරයේ දිස්වනු ඇත: Covid-19 සක්‍රීය (රතු)/ වැළඳී සුව වූ (තැඹිලි)/ නිරෝධායනය ලක්වූ (දුඹුරු)/ නිරෝධායනය නිමකරන ලද (කොළ)/ පසුගිය දින 14/28 අතර පිටරට සිට පැමිණි (තද දම්). තවද, ඔබ සාප්පු සංකීර්ණයක් වැනි ස්ථානයකට යාමට පෙර ගතික සිතියමක් මත අනතුරු මට්ටම බලාගැනීමටද හැකිවේ. මෙම ඇප් එක සමගින් අප රටේ ආදායමෙන් 13%ක් උත්පාදනය කරන සංචාරක කර්මාන්තය විවෘත කිරීමේ හැකියාවද ඇත. COVID සැකසහිත පුද්ගලයින් ඔවුන්ගේ නිවෙස්වලම/ හෝටලයක ස්වයං නිරෝධායනයට ලක්කිරීමට අවශ්‍ය වන්නේ නම් Geofencing ආරක්ෂක පහසුකමද පවතී. පුද්ගලයෙකු ආසාදිතවූ විට, අවශ්‍ය වන්නේ නම් පසුගිය දින 14 දක්වා ඔහුගේ/ඇයගේ ආශ්‍රිතයින් හඳුනාගැනීමේ පහසුකම ද මෙම ඇප් එක සතුය. පුද්ගලයෙක්ගේ අවදානම් මට්ටම

දක්වන QR කේත ලක්ෂණයද මෙම ඇප් එකෙහි ඇතුලත් බැවින් දැනට සිදුකරන ශරීර උෂ්ණත්වය මැන බැලීමේ ක්‍රමයට අමතරව පොදු ස්ථානයකට ඇතුලුවීමේදී ආරක්ෂක ක්‍රමයක් ලෙස ද භාවිතා කළ හැකිය. අනාගතයේදි ඇතිවිය හැකි වෙනත් වසංගතයන් පාලනය කිරීම සඳහා මෙන්ම ඩෙංගු රෝගී පොකුරු පෙන්නුම් කිරීම සඳහාද මෙම ඇප් එක යොදාගත හැකි වනු ඇත.

COVID-19 රෝගීන් විශාල ලෙස පැතිරීම පාලනය කරන ලද රටවල් බොහොමයක්ම සිය රෝග පාලන වැඩසටහන්වල අත්‍යවශ්‍ය කොටසක් ලෙස ඔවුන්ටම අයත් ජංගම දුරකථන පාදක ඇප් සාර්ථක ලෙස යොදාගෙන ඇත. පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන අතරම යම් වසංගතයක් පාලනය කිරීම සඳහා ලක්ෂණ විශාල සංඛ්‍යාවකින් සමන්විත මෙය ලෝකයේ නිපදවන ලද වඩාත් උසස් ඇප් වලට බෙහෙවින් සමානවේ. මෙම ඇප් එක ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) හරහා අවශ්‍ය වන රටවල්වලට නොමිලේ ලබාදීමට පර්යේෂකයින් විසින් සැලසුම්කර තිබුණි.



3. NRC විසින් මූල්‍යාධාර ලබාදුන් ව්‍යාපෘති : පර්යේෂණ ප්‍රතිඵල කාර්මික යෙදවුම් සඳහා යොදාගැනීම.

මීට පෙර නිමකරන ලද පර්යේෂණ ප්‍රදානයන් (NRC මගින් මූල්‍යාධාර සපයන ලද) අතරින් කාර්මික වශයෙන් යොදාගත හැකි පර්යේෂණ ප්‍රතිඵල හඳුනාගැනීමේ වැඩපිළිවෙලක් ජාතික පර්යේෂණ සභාව විසින් ආරම්භකර ඇත. එකී පර්යේෂණ ප්‍රතිඵල යොදාගැනීම සඳහා අදාල පාර්ශවකරුවන් හා අදාල අමාත්‍යාංශ සඳහා මග පෙන්වීමේ සැලසුම් ආයතනය සතුවිය. මෙහි ආරම්භක පියවරක් ලෙස ජාතික පර්යේෂණ සභාවේ කාර්යසාධන හා ඇගයීම් කමිටුව විසින් කාර්මික වශයෙන් යොදාගත හැකි පර්යේෂණ ප්‍රතිඵල ලබා ඇති පර්යේෂණ ව්‍යාපෘති 11ක් හඳුනාගනු ලැබූ අතර ඒවායේ ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වන ලෙස උපදෙස් දෙනු ලැබිය.

ප්‍රදාන අංකය	පර්යේෂණයේ මාතෘකාව
11-178	Synthesis of value-added products from Sri Lankan dolomitic marbles
12-081	Bioactivity studies and activity guided separation of anti-inflammatory compounds from Alpinia calcarata rhizome and leaf
12-113	Molecular and biochemical characterization of Sri Lankan pomegranates and expression analysis of major hydrolyzable tannin genes under different environmental conditions and maturity stages to popularize cultivation in Sri Lanka
12-145	Unified Framework for Healthcare Application Integration: Clinic Management Solution for Public Sector Health Service Institutes
13-087	Development of natural adsorbents for heavy metal and textile dye contaminated waste water treatment
15-147	Assessment of efficacy of floating macrophytes Eichhornia crassipes, Salvinia molesta and Pistia stratiotes in controlling nutrient content and heavy metal levels in sludge from common waste treatment plant (CWWTP) – Biyagama - Sri Lanka

15-154	Development of postharvest treatments and a storage strategy for enhancement of postharvest life of lime (Citris aurantfolia swingle)
15-020	Enhancement of Shelf life of Fish and Fishery Products by Gamma Irradiation
15-087	Identification of prevalence and pathogens of subclinical mastitis development of an enzyme assay system based on enzymes found in milk for early detection of mastitis.
15-155	Treatment of textile effluents using a combination of chemical and physiochemical process
15-139	Use of King Coconut husk to produce an organic potassium source for agricultural use

ආරම්භක පියවරක් ලෙස NRC විසින් 2020 වසරේදී ඉහත තෝරාගත් ප්‍රදානයන් අතරින් පර්යේෂණ 03ක් සඳහා ඉදිරිපත් කිරීම් (විශේෂයෙන් දැක්වීම) කරනු ලැබූ අතර ඒ පිළිබඳව මගපෙන්වීම හා තවදුරටත් වැඩිදියුණු කිරීම් සඳහා එහිදී ලද පාර්ශවකරුවන්ගේ අදහස් උදහස් රේඛීය අමාත්‍යාංශය වෙත දන්වනු ලැබීය.

4. ජාතික පර්යේෂණ සභාව විසින් සුභසාධන ප්‍රදානයන් ආරම්භ කෙරේ.



පළමු සුභසාධක ප්‍රදානය ලෙස ‘‘ද සොයිසා කාන්තා රෝහල සඳහා රෝගීන් ලියාපදිංචි කිරීමේ කාර්යාලයක් සැලසුම් කිරීම, වැඩිදියුණු කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙනයාම’’ සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් මූල්‍යාධාර ලබාදෙනු ලැබීය. එමගින් ලැබෙන නිමවුම වන්නේ පහත ගැටලු වලට විසඳුම් ලබාදීම සඳහා ආයතනය තුල සැකසූ රෝගීන් පිළිබඳ දත්ත ගබඩාවක් ඇතුලත් මෘදුකාංගයකි;

- ඒකකය මගින් සපයන සේවාවන් පිළිබඳ ක්‍රමවත් දත්ත රැස්කිරීමක් හා දත්ත එකතුවක් නොමැතිවීම - ද සොයිසා කාන්තා රෝහල (DSHW වාට්ටු අංක 3 සහ 15).
- ඒකකය තුල පුනරාවර්තව හා අඛණ්ඩව සායනික විගණන ආකාරයෙන් සිදුකළ යුතු අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා යටිතල පහසුකම් නොමැතිවීම.
- රට තුල ප්‍රසව විද්‍යා සේවාවන් සැලසීමේදී ආරක්ෂාව පිළිබඳ ප්‍රමිතීන් සඳහා ආදර්ශ මොඩලයක් නොමැතිවීම.
- දුර්වල තත්ව ආවේක්ෂණ ක්‍රමවේදය (මාතෘ මරණ ආවේක්ෂණය පිළිබඳව අවධානය යොමුකිරීම අවශ්‍යවේ).

ATTACHED

ATTACHED

සම්බන්ධවීම සඳහා තොරතුරු

ජාතික පර්යේෂණ සභාව

120/7, විද්‍යා මාවත, කොළඹ 07.

පොදු දුරකථන:	**011-2675176**	ෆැක්ස්:	**011-2675136**
ඊමේල්:	admin@nrc.gov.lk	වෙබ් අඩවිය:	www.nrc.gov.lk

වාර්ෂික ගිණුම් - 2020

ජාතික පර්යේෂණ සභාව

2021 පෙබරවාරි 25

ජාතික පර්යේෂණ සභාව
120/07, විද්‍යා මාවත, කොළඹ 07
වෙබ් අඩවිය: www.nrc.gov.lk ඊ මේල්: admindesk@nrc.gov.lk

මූල්‍ය ප්‍රකාශනයන්හි සංරචක

මූල්‍ය වර්ෂය - 2020 දෙසැම්බර් මාසයෙන්අවසන් වන වසර

- මූල්‍ය තත්ව ප්‍රකාශනය
- මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
- මූදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ශුද්ධ වත්කම්/ සම කොටස් වෙනස්වීමේ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

		2020 රු.	2019 රු.
වත්කම්	**සටහන්**		
ජංගම වත්කම්			
මුදල් හා මුදලට සමාන දෑ - NRC		22,152,635.55	21,874,088.90
ණය		267,224.29	179,000.34
T/T සඳහා අත්තිකාරම්		1,307,271.37	1,236,502.55
ජා.ප.ස.කාර්ය මණ්ඩල ණය - ජංගම කොටස	1	571,806.00	-
TO වැඩසටහන	2	123,357,981.54	152,811,687.60
ID ප්‍රදානයන්	2	207,177,548.48	236,397,125.37
ජා.ප.ස.PPP වැඩසටහන්	2	26,978,447.09	30,989,133.89
EWC ප්‍රදානයන්	2	10,831,322.48	19,671,895.63
සුභසාධක ප්‍රදානය	2	1,440,000.00	-
RR ප්‍රදානයන්	2	1,889,661.67	-
Asbestos ප්‍රදානයන්	2	400.00	592,248.64
වෙනත් මූල්‍ය වත්කම්	3	257,478.32	--
		396,231,776.79	**463,751,682.92**
ජංගම නොවන වත්කම්			
ජා.ප.ස.කාර්ය මණ්ඩල ණය		1,936,933.32	1,779,794.71
වෙනත් මූල්‍ය වත්කම්	4	1,965,000.00	2,162,993.00
දේපළ, පිරියත හා උපකරණ	5	282,432,591.49	289,499,512.68
අස්පෘශ්‍ය වත්කම්		1,083,335.00	725,520.00
ජංගම නොවන වත්කම් එකතුව		**287,417,859.80**	**294,167,820.39**
මුළු වත්කම්		**683,649,636.60**	**757,919,503.31**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	6	7,735,579.88	9,040,131.37
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන		847,420.00	408,852.50
මුළු වගකීම්		8,582,999.88	9,448,983.87
ශුද්ධ වත්කම්		**675,066,636.72**	**748,470,519.44**
ශුද්ධ වත්කම්/සම කොටස්			
ප්‍රාග්ධන දායකත්වයන්;			
ප්‍රාග්ධන ප්‍රදාන		616,550,916.58	693,442,477.16
සමුච්චිත අතිරික්තයන්/ (හිඟයන්)		58,515,720.14	55,028,042.28
පරිපාලිත ආයතනයන්ට අයත් කොටස		-	-
ශුද්ධ වත්කම්/සම කොටස් එකතුව		**675,066,636.72**	**748,470,519.44**

පිටු අංක **06 සිට 11** දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක **12 සිට 21** දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම ජාතික පර්යේෂණ සභාවේ වගකීමක්වේ. මෙම මූල්‍ය ප්‍රකාශන කවුන්සිලය විසින් අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

මහාචාර්ය එච්.දොඩම්පහල		**එම්.සී.රාජපක්ෂ මිය**	**ආර්.ඩී.එස්. දිසානායක මයා**
සභාපති/ ජා.ප.ස	**කවුන්සිල සාමාජික**	**ප්‍රධාන විධායක නිලධාරී**	**සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන)**

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2020 රු.	*2019* *රු.*
ආදායම			
පුනරාවර්තන ලැබීම් - ජා.ප.ස.පරිපාලනය	*9*	28,565,000.00	23,764,870.00
ප්‍රාග්ධන ප්‍රදාන		2,796,150.98	2,387,027.49
පුනරාවර්තන ලැබීම් - පර්යේෂණ හා සංවර්ධන	8	150,847,150.86	183,322,767.58
වෙනත් ලැබීම්		1,910,373.56	2,833,432.39
Asbestos සඳහා ලැබීම්		400.00	1,432,778.18
මාරුකරනලද මුදල් - ජා.ප.ස.		443,312.11	355,062.18
මුළු ආදායම		**184,562,387.51**	**214,095,937.82**
වියදම්			
පුද්ගල වැටුප්		16,159,336.81	13,566,943.60
පර්යේෂණ හා සංවර්ධන	7	99,327,502.83	133,901,942.85
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	10	10,369,573.70	10,727,961.46
ක්ෂයවීම් වියදම් - ජා.ප.ස.ප්‍රදානයන්	5	51,519,648.03	49,420,824.73
ක්ෂයවීම් - ජා.ප.ස.කාර්යාල උපකරණ	5	2,796,150.98	2,387,027.49
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා		647,200.00	649,600.00
මූල්‍ය පිරිවැය		3,750.00	13,350.00
මාරුකරනලද මුදල් - ජා.ප.ස.		443,312.11	355,062.18
මුළු වියදම්		**181,266,474.47**	**211,022,712.31**
පරිපාලින සමාගම් වල අතිරික්ත කොටස			
කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය		3,295,913.04	3,073,225.51
ලැබිය යුතු:			
පාලනය කරන ආයතනයේ හිමිකරුවන්		3,295,913.04	3,073,225.51
පරිපාලින ආයතනයන්ට අයත් කොටස		-	-
		3,295,913.04	**3,073,225.51**

*පිටු අංක **06 සිට 21** දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලින කොටසකි.*

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

	සටහන්	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මූල්‍ය ප්‍රවාහ			
ලැබීම්			
බදුකරණය		-	-
භාණ්ඩාගාරයෙන් ලැබීම් (පුනරාවර්තන)		28,565,000.00	23,764,870.00
භාණ්ඩාගාරයෙන් ලැබීම් (සංවර්ධන සහය)		75,200,000.00	93,000,000.00
භාණ්ඩ හා සේවාවන් විකිණීම		-	-
අවසන්කරන ලද ප්‍රදානයන් මගින් ලැබීම්		32,856,653.86	67,718,155.14
වෙනත් ලැබීම්	11	2,078,640.82	6,153,332.52
ලැබූ පොළිය		72,793.56	-
ලැබූ වාරිකයන්		530,680.39	-
වෙනත් ලැබීම් - ණය		744,750.00	-
ගෙවීම්			
සේවකයින් සඳහා මුදල් ගෙවීම්		(16,319,702.57)	(14,250,875.85)
විශ්‍රාම පාරිතෝෂික		-	-
සැපයුම්කරුවන්		-	-
පර්යේෂණ ප්‍රදාන හා වෙනත් වැඩසටහන්	12	(109,324,387.37)	(170,818,525.19)
කාර්ය මණ්ඩල ණය		(1,260,000.00)	-
වෙනත් ගෙවීම්		(11,917,773.09)	(11,322,645.64)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**1,226,655.60**	**(5,755,689.02)**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් මූල්‍ය ප්‍රවාහ			
පිරියත හා උපකරණ මිළදී ගැනීම		(859,885.00)	(1,780,994.52)
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**(859,885.00)**	**(1,780,994.52)**
මූදල් හා මූදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		366,770.60	(7,536,683.54)
කාලසීමාව ආරම්භයේ මූදල් හා මූදලට සමාන දෑ		22,053,089.24	29,410,772.44
කාලසීමාව අවසානයේ මූදල් හා මූදලට සමාන දෑ		**22,419,859.84**	**21,874,088.90**

පිටු අංක 06 සිට 21 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.
වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ සම කොටස් වෙනස්වීමේ ප්‍රකාශනය

	සටහන්	සමුච්චිත අතිරික්තය හෝ නැවත ප්‍රකාශිත හිඟය	නැවත ප්‍රකාශිත ප්‍රාග්ධන ප්‍රදාන	මුළු ශුද්ධ වත්කම්/සම කොටස්
		රු.	රු.	රු.
2020/01/01 දිනට ශේෂය		**55,028,042.28**	**693,442,477.16**	**748,470,519.44**
2019 වසරේ ලාභය සඳහා ගැලපීම්				
පශ්චාද් උපාධි දීමනා සඳහා ගැලපුම් - 2019	15	(131,500.00)	-	(131,500.00)
2020ට අදාල රක්ෂණ ප්‍රතිවර්තනය		12,251.00	-	12,251.00
වත්කම් අපහරණය හා ක්ෂය කිරීම් නිවරදි කිරීම		41,510.80	-	41,510.80
පෙර වසරේ වියදම් අවලංගු කිරීම	16	147,882.30	-	147,882.30
ඉල්ලා අස්වූ සේවකයින් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන ප්‍රතිවර්තනය		31,162.50	-	31,162.50
2019 වසරේ කුරියර් සේවා ගෙවීම් ගැලපුම් කිරීම		(5,211.00)	-	(5,211.00)
2018 වසරේ වැඩිපුර ලබාදෙන ලද අභ්‍යන්තර විගණන ගාස්තු ප්‍රතිවර්තනය		6,545.00	-	6,545.00
වැඩිපුර ලබාදෙන ලද සාමාන්‍ය විගණන ගාස්තු ප්‍රතිවර්තනය		22,680.00	-	22,680.00
2019 වසරේ සාමාන්‍ය විගණන ගාස්තු ප්‍රතිපාදන වැඩිවීම		(21,426.00)	-	(21,426.00)
2019 වසරට අදාල පශ්චාද් උපාධි දීමනා ගෙවීම්		(93,000.00)	-	(93,000.00)
2019 වසරේ ධාරිතා වර්ධනය නිවරදි කිරීම		673,870.22	(673,870.22)	-
ගලපන ලද සමුච්චිත අතිරික්තය		**55,712,807.10**	**692,768,606.94**	**748,481,414.04**
අරමුදල් මාරු කිරීම සඳහා Asbestos ආදායම ප්‍රතිවර්තනය	17	(493,000.00)		(493,000.00)
2020 වසර තුල ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන		-	75,200,000.00	75,200,000.00
PPP සමාගම - පියවන ලද ප්‍රදාන		-	2,668,923.60	2,668,923.60
2020 වසර සඳහා ආදායමක් ලෙස හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන	13	-	(83,607,810.73)	(83,607,810.73)
ප්‍රාග්ධන වත්කම් හා අපහරණ මත පාඩුව සම්බන්ධයෙන් ක්ෂයකිරීම.	14	-	(70,478,803.23)	(70,478,803.23)
		55,219,807.10	616,550,916.58	671,770,723.68
		55,219,807.10	616,550,916.58	671,770,723.68
2020 කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)		3,295,913.04	-	3,295,913.04
2020/12/31 දිනට ශේෂය		**58,515,720.14**	**616,550,916.58**	**675,066,636.72**

පිටු අංක 06 සිට 21 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි. වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය

අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපති නියෝගයක් මත විශේෂ ආයතනයක් ලෙස ඇතිකරනු ලැබූ ජාතික පර්යේෂණ සභාව ("NRC"), 2016 ජූලි 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගත් 2016 අංක 11 දරණ පනත මඟින් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ලෙස ස්ථාපනය කෙරිණි.

ජාතික පර්යේෂණ සභාව, අංක 120/7, විද්‍යා මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය ආයතනයකි.

මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් සඳහා පිළියෙල කොට ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපතිතුමන් විසින් නිකුත් කරනු ලැබූ නියෝගයක් අනුව අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් දක්වා ඇති ජාතික පර්යේෂණ සභාවේ කාර්යයන්, 2016 ජූලි 29 දිනැති ගැසට් පත්‍රයෙහි පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් 2016 අංක 11 දරණ පනත හරහා ප්‍රතිසංස්කරණයට ලක්විණි. ප්‍රකාශිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වසර තුල පහත දැක්වෙන ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

පර්යේෂණ ප්‍රදාන සහ ආචාර්ය උපාධි වැඩසටහන

- රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි පර්යේෂණයන් සහ පශ්චාත් උපාධි අධිශිෂ්‍යත්ව සඳහා මූල්‍යාධාර ලබාදීම. මෙම වර්ෂය තුලදී මෙම වැඩසටහන "අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන" වශයෙන් එක් වැඩසටහනක් ලෙස ඒකාබද්ධ කෙරිණි.

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

- ශ්‍රී ලාංකීය පර්යේෂකයින් සහ පර්යේෂණ ආයතන සඳහා පිළිගැනීමක් ලබාදීම.

මෙම වසර තුලදී මෙම වැඩසටහනෙහි නාමය "විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන" ලෙස වෙනස් කරණු ලැබිණි.

පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන

- ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා පෞද්ගලික අංශයේ/රාජ්‍ය අංශයේ පර්යේෂණ අවශ්‍යතාවයන් මූල්‍යනය කිරීම.

පෞද්ගලික අංශයේ සහයෝගීතා වැඩසටහන හරහා පෞද්ගලික අංශයේ ආයෝජන සිදුකෙරෙන අතර මෙම වර්ෂය තුල රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති අටක් ක්‍රියාත්මකව පැවතුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 දිනට මෙම පෞද්ගලික සහයෝගීතා ගිණුම්වල ශේෂයන් රු. 24,439,822.81 ක් විය.

වෙනත් සංවර්ධන වැඩසටහන්

- ජාතික පර්යේෂණ සභාවෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් වැඩසටහන්

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ විශාල ව්‍යාපෘති වැඩසටහන

ජාතික පර්යේෂණ සභාව සිය මූල්‍යයන ප්‍රතිපත්ති සංශෝධනය කර ඇති අතර ඉලක්ක මත පදනම් වූ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා 2014 වසරේ සිට ප්‍රමුඛත්වය හිමිවනු ඇත. රජයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි සහ විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ කණ්ඩායම් වෙතින්, රටෙහි ආර්ථික සංවර්ධනය, සමාජීය සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින් ජාතික ගැටලු විසඳීම කෙරෙහි යොමුවූ ඉලක්කමත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යයනය කිරීම සඳහා සෑම වර්ෂයකම පූර්ව යෝජනා කැඳවනු ලැබේ. වසර 5ක කාලසීමාවක් සඳහා පිරිනැමෙන මෙම එක් ප්‍රදානයක වටිනාකම රු. මිලියන 50ක් දක්වා වනු ඇත. ජාතික විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති වාර්තාවට අනුකූලව ප්‍රමුඛ ක්ෂේත්‍ර කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ඇත.

1.2 නිකුත් කිරීම සඳහා අවසරය ලබාදෙන දිනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාවෙහි මූල්‍ය ප්‍රකාශනයන් නිකුත් කිරීම සඳහා කවුන්සිලයේ සාමාජිකයින්ගේ අනුමැතිය ඇතිව පර්යේෂණ සභාවේ සභාපති, ප්‍ර.වි.නි හා ගණකාධිකාරිවරයා විසින් 2020/03/05 දින අවසර ලබාදෙන ලදී.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව පිළියෙල කර ඇත.

2.1.1 අනුකූලතා ප්‍රකාශය

ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) වලට අනුකූලව පිළියෙල කර ඇත.

2.1.2 අඛණ්ඩ පැවැත්ම

ජාතික පර්යේෂණ සභාවට පුරෝකථනය කරන ලද අනාගතයක් සඳහා සිය ක්‍රියාකාරකම්හි අඛණ්ඩව නියැලීමට අවශ්‍ය පමණ සම්පත් ඇති බවට කවුන්සිලය සෑහීමකට පත්වී ඇත. තවද, සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පිළිබඳව සභාවේ කමිටු සාමාජිකයන් දැනුවත් වී නොමැත.

2.1.3 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙලකර ඇති අතර මෙම ගිණුම් සඳහා බලපාන උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නැත.

2.1.4 මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ජාතික පර්යේෂණ සභාවෙහි මෙහෙයුම් මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ලෙසකින් දක්වා නොමැත්තේ නම් ආසන්න සතයට දක්වනු ලැබේ.

2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

මූල්‍ය තත්වය ප්‍රකාශනයන්හි දක්වා ඇති යම් යම් ධාරණ අගයන් මැනීමේදී සිදුකරන ලද උපකල්පනයන්ට හා ඇස්තමේන්තුවලට මූල්‍ය ප්‍රකාශනයන් සංවේදී වේ වන අතර ප්‍රමාණයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වේ. මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් අනාවරණය කර ඇති වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන් සඳහා ප්‍රමාණාත්මක ගැලපීම් සිදුවීමේ සැලකිය යුතු අන්දමේ අවදානමක් මෙමඟින් ප්‍රතිඵල වනු ඇත.

ශ්‍රීලරාඅගිප්‍ර (SLPSAS)ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් ලෙස වාර්තා කළ අගයන්ට බලපාන විවිධ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම අවශ්‍යවේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ යම් යම් තත්ත්වයන් මත සාධාරණයයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළත් වූ වෙනත් සාධක මත පදනම්වේ. එබැවින්, සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵලයන් මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදකවූ උපකල්පනයන්, සිදුකෙරෙමින් පවතින පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා සිදුකරනු ලබන සංශෝධනයන්, එම සංශෝධනය සිදුකරනු ලබන කාලසීමාව සඳහා හා කිසියම් අනාගත කාලසීමාවන් සඳහා පමණක් බලපාන්නේ නම්, එම කාලසීමාව තුළ හඳුනා ගැනේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

පහත දැක්වෙන සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය හා අනුරූප වේ.

සමහර සංසන්දනාත්මක තොරතුරු වර්තමාන වර්ෂයේ තොරතුරුවලට අනුකූලවීම සඳහා අවශ්‍ය විටක නැවත වර්ගීකරණය කර ඇත.

3.1 විදේශ මුදල් පරිවර්තනය

සියළු විදේශ මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දින පැවති විනිමය අනුපාතිකයට මෙහෙයුම් කරන ලද මුදල් වර්ගයට පරිවර්තනය කර ඇත.

3.2 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ වාර්තා කරන දින සිට අවුරුද්දක් තුළ යන දෙකෙන් කෙටි කලකදී උපලබ්දි වීම අපේක්ෂා කළහැකි මුදල් හා බැංකු ශේෂයන් වත්කම්

වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මීට අමතරව 2019 වසරේදී ජංගම නොවන වෙනත් මූල්‍යමය වත්කම් ලෙස හඳුනාගනු ලැබූ උත්සව අත්තිකාරම් හා නිෂ්පාදන භාගය 2020 මූල්‍ය වර්ෂය තුල වෙනත් ජංගම මූල්‍ය වත්කම් ලෙස නිවරදි ලෙස වර්ගීකරණය කරනු ලැබීය.

3.2.1 දේපළ, පිරියත හා උපකරණක

3.2.1.1 මූලික හඳුනාගැනීම

දේපළ, පිරියත හා උපකරණ වල සියලුම අයිතම පිරිවැයෙන් සම්මුචිත ක්ෂයකිරීම් අඩුකළ අගයට මනිනු ලැබේ. ඒවා මූලිකව පිරිවැයට හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමේ පිරිවැය හෝ වත්කම් අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට සෘජුවම දරණ ලද ආනුශංගික පිරිවැය හා යම් වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට හා එම වත්කම් කොටස් කිරීම හා පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුලත්වේ. මීට අමතරව ජා.ප.ස. මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම හේතුවෙන් ගෙවීම් ඉවතලෑම/ප්‍රතික්ෂේප කිරීම සිදුවිය හැකි බැවින් වත්කම් පෙර දිනයක අත්පත්කරගෙන තිබුණද, වත්කම් මිලදී ගැනීමේ දිනය නොසළකා අදාල ආයතනයට ගෙවීමකළ දිනය ජා.ප.ස. විසින් වත්කම් මිලදීගැනීමේ දිනය ලෙස හඳුනාගනු ලැබේ. යම් දේපළ, පිරියත හා උපකරණ කොටස් සඳහා විවිධ ප්‍රයෝජනවත් ආයු කාලයන් ඇති අවස්ථාවන්හිදී ඒවා වෙනම දේපළ, පිරියත හා උපකරණ අයිතම ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන මගින් මිලදී ගන්නා දේපළ, පිරියත හා උපකරණ වත්කම් පවරාදෙන තෙක් හෝ අපහරණය කරන තෙක් ජාතික පර්යේෂණ සභාවේ දේපළ, පිරියත හා උපකරණවල කොටසක් ලෙස නාවකාලිකව හඳුනා ගැනේ.

පහත 3.2.1.3හි විශේෂයෙන් දක්වා ඇති පදනම මත සමුච්චිත ක්ෂය කිරීම් ගණනය කෙරේ.

3.2.1.2. තදනන්තර වියදම්

දේපළ, පිරියත හා උපකරණ වල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන වියදම, එම කොටස මගින් ජාතික පර්යේෂණ සභාවට/ ජාතික පර්යේෂණ සභා ප්‍රදානයන්ට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාවක් ඇතිනම් හා එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකිනම් එම අයිතමයේ ධාරණ අගය තුල හඳුනාගනී. මෙයට මූලික පරීක්ෂා කිරීම් හා පිළිසකර කිරීම් සඳහා වන වියදම් ඇතුලත්වන අතර වෙනම ගිණුම්ගත කෙරේ.
දේපළ, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීම සඳහා පිරිවැය දරන ආකාරය අනුව ලාභ හා පාඩු ලෙස හඳුනා ගැනේ.

මූලිකව තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතිය මඟින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිස්ථාපනය හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත හා උපකරණ අළුත්වැඩියා හෝ නඩත්තු කිරීම ඇතුලත් වෙනත් සියලු වියදම් සිදුකරනු ලැබූ විට වියදමක් ලෙස හඳුනාගැනේ.

3.2.1.3 ක්ෂය කිරීම

එකී වියදම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුල කපාහැරීම සඳහා ක්ෂය කිරීම් ස්ථාවර වත්කම් වල පිරිවැය මත ගණනය කරන ලද ලාභ හා පාඩු තුල හඳුනා ගැනේ.

වත්කම් භාවිතය සඳහා ලබාගත හැකි දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ආයුකාලය මත සෘජු රේඛා පදනමින් ලාභ හා අලාභ ගිණුමේ ක්ෂයකිරීම් හඳුනා ගනු ලැබේ. තවද, යම් උපකරණයක භාවිතයට සූදානම් නිශ්චිත දිනය හඳුනාගැනීමට ප්‍රායෝගිකව අපහසු බැවින් මෙන්ම ජා.ප.ස. මාර්ගෝපදේශ සියල්ල සපුරාලීම සිදුනොකර එය උපකරණයක් ලෙස සළකනු නොලැබීම හා ගෙවීම සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප විය හැකි බැවින් ප්‍රදානයන්ගෙන් මිලටගත් භාණ්ඩ සඳහා ගෙවීම් සිදුකළ දිනය ඒවා මිලදී ගත් දිනය ලෙස ජා.ප.ස. විසින් හඳුනා ගනු ලැබේ.

ජා.ප.ස. විසින් වත්මන් හා සන්සන්දනාත්මක කාලසීමාවන් සඳහා සාමාන්‍යයෙන් භාවිතාකරන ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය හා වාර්ෂික ක්ෂයකිරීම් ප්‍රතිශතයන් පහත පරිදිවේ:

විවිධ වත්කම්	වසර 2	50.00%
හැඳි ගෑරුප්පු හා පිහන් කෝප්ප	වසර 3	33.33%
කාමර තිර රෙදි	වසර 3	33.33%
ආරක්ෂක උපකරණ	වසර 3	33.33%
පුස්තකාල පොත්	වසර 3	33.33%
පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා උපාංග	වසර 5	20.00%
ගණක යන්ත්‍ර හා ඔරලෝසු	වසර 5	20.00 %
බල සැපයුම් උපකරණ	වසර 5	20.00 %

පිත්තල අයිතම	වසර 5	20.00 %
මෝටර් වාහන	වසර 5	20.00 %
වායු සමීකරණ යන්ත්‍ර/ සේප්පු	වසර 5	20.00 %
ගොඩනැගිලි	වසර 10	10.00 %
පුළුල්කළ හැකි වත්කම්	වසර 10	10.00 %
යන්ත්‍රෝපකරණ හා මෙවලම්	වසර 10	10.00 %
කාර්යාල උපකරණ	වසර 10	10.00 %
ශීතකරණ	වසර 10	10.00 %
CCTV පද්ධති	වසර 5	20.00 %
අස්පෘශ්‍ය වත්කම්	වසර 4	25.00%
ADSL අන්තර්ජාල	වසර 1	100.00%
කොක්සියල් කේබල්	වසර 4	25.00%
MIDAS FEA මෘදුකාංගය	වසර 4	25.00%
Wi-Fi Access Point	වසර 4	25.00%

පර්යේෂණ ප්‍රදානයන් මඟින් මිලදී ගත් දේපළ, පිරියත හා උපකරණ වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය ඒවා පවරනු ලබනතෙක් හෝ අපහරණය කරනතෙක් පහත සඳහන් ප්‍රයෝජනවත් ආයුකාලයන් හා ප්‍රතිශතයන්ගෙන් ක්ෂය කෙරේ.

රසායනාගාර උපකරණ (1 කාණ්ඩය)	වසර 10	10%
රසායනාගාර උපකරණ (2 කාණ්ඩය)	වසර 5	20%

ක්ෂය කිරීමේ ක්‍රම, ප්‍රයෝජනවත් ආයු කාලය හා අවශේෂ වටිනාකම් වාර්තා කරන දිනයට යලි තක්සේරු කරනු ලැබේ. මිලදී ගැනීමේ/පවරාදීමේ/අපහරණය කිරීමේ දිනය පදනම්ව ක්ෂයකිරීම් ගණනය කිරීමේ ප්‍රතිපත්තිය වෙනස්වී ඇති අතර 2019 මුදල් වර්ෂයේ සිට ක්‍රියාත්මක නව ක්ෂයකිරීමේ ප්‍රතිපත්තිය අනුව සියලුම ස්ථාවර වත්කම් සඳහා මිලදීගත් දිනය හා අපහරණ/පවරන ලද කළ දින නොසලකා සම්පූර්ණ මාසය සඳහා අපහරණය වෙන් කර ඇත.

3.2.1.2. ශේෂ පත්‍රයෙන් කපාහැරීම

